# 2022.01.21 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව
# මීගහකිවුල ප්‍රාදේශීය සභාව

**පැමිණීම.**

01.ගරු සභාපති - එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා
02.ගරු උප සභාපති - ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා
03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා
04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා
05.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සුමතිපාල උඩලකුඹුර මැතිතුමා
06.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.එම්.ශ්‍රියාලතා මැතිණිය
07.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා
08.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -ඩී.එම්.ශ්‍රියාණි සාමාවතී මැතිණිය
09.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා
10.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.පී. බාලසුන්දරම් මැතිතුමා
11.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා
12.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එම්.නිශාදි ශිරන්තිකා මැතිණිය
13.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.එන්.එම්.නන්දන සම්පත් උදය කුමාර මැතිතුමා
14.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.චමින්ද ප්‍රදීප් මැතිතුමා
15.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.මංජුල දිසානායක මැතිතුමා
16.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.පත්මා කුමාරි මැතිණිය
17.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා
18.සභා ලේකම් - එම්.ඩී.කේ.සී.ගුණතිලක මිය
19.විෂය නිලධාරි - ආර්.එම්.නිල්මිණි සකුන්තලා මිය

**සභාව ආරම්භ කිරිම.**

පෙ.ව. 10.00ට ගරුසභාපතිතුමා මූලාසනය ගනිමින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා,ගරු මන්ත්‍රීතුමන්ලාත්,සභා ලේකම්තුමිය හා විෂය නිලධාරී පිළිගනිමින් සභා රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.මූලාසනය විසින් එදින න්‍යාය පත්‍රානුකූලව මුලින්ම පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීමට සභාවට ඉදිරිපත් කරන ලදී.

**(අ) පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කර ගැනීම.**

මෙහිදී මූලාසනය සභාව අමතමින් ගරු මන්ත්‍රීවරුනි, පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව කියෙව්වා සේ සළකා සභා යෝජනා ස්ථිරත්වයෙන් සම්මත කර සභා වාර්තාවල සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙස මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමනි,පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තා බැවින් සභා සම්මත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

මූලාසනය සභාව අමතමින් පසුගිය සභා වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙස මම මේ ගරු සභාවට දන්වා සිටිනවා.

**මූලාසනය සභාව අමතමින් පසුගිය සභා වාර්තවේ සංශෝධන කිසිවක් නොමැති බැවින් පසුගිය මහ සභා වාර්තාව සම්මත කිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සභාවේ සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත වූ බව සභාවට දන්වන ලදී.**

ගරු සභාපතිතුමා සභාව අමතා න්‍යාය පත්‍රානුකූලව විශේෂ නිවේදන ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

(ආ)ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

ගරු සභාපතිතුමා විසින් විශේෂ නිවේදනය සභාව හමුවේ තබන ලදී.

1.ග්‍රාමීය පාලම් අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී.

මූලාසනය සභාව අමතමින් ග්‍රාමීය පාලම් අලුත් වැඩියා කිරීමේ යෝජනා කාර්යාලයේ දර්ශන මහත්තයාට දීලා යන්න.

ගරු සභාපතිතුමා සභාව අමතා න්‍යාය පත්‍රාණුකූලව සංදේශ,පැමිණිලි,පෙත්සම් හා ආයාචනා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

**(ඇ)සංදේශ, පෙත්සම් පැමිණිලි සහ ආයාචනා සභාගත කිරීම.**

ගරු සභාපතිතුමා සභාව අමතමින් මෙම සභා වාරය සඳහා සංදේශ,පැමිණිලි,පෙත්සම් හා ආයාචනා කිසිවක් ලැබී නොමැති බව මා මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා.

මීළඟට ගරු සභාපතිතුමා සභාව අමතා න්‍යායපත්‍රාණුකූලව කල් දෙනු ලැබූ ප්‍රශ්න ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

**(ඈ) කල්දෙනු ලැබූ ප්‍රශ්න**

ගරු සභාපතිතුමා සභාව අමතමින් මෙම සභා වාරය සඳහා කල්දෙනු ලැබූ ප්‍රශ්න කිසිවක් ලැබී නොමැති බව මා මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා.

මීළඟට ගරු සභාපතිතුමා සභාව අමතා න්‍යායපත්‍රාණුකූලව යථා පරිදි කල් දී ඇති යෝජනා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

ගරු සභාපතිතුමා විසින් පළමු යෝජනා සභාව හමුවේ තබන ලදී.

1) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් පුංචි ලෝකාන්තය සංවර්ධනය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදි.

**පුංචි ලෝකාන්තය සංවර්ධනය කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා ස්ථිර කලේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදි.**

මීළගට මූලාසන සභාව අමතමින් යෝජනා අංක 02 ට අදාළ ලිපිය ඉදිරිපත් කරන ලදී.

2) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් ජල යෝජනා ක්‍රම සඳහා ජල නල උපාංග හා ජල මීටර් ලබා ගැනිම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදි.එම උපාංග මිලදි ගැනිමට සභාව විසින් තිරණය කරන ලදි.

මීළගට මූලාසන සභාව අමතමින් යෝජනා අංක 03 ට අදාළ ලිපිය ඉදිරිපත් කරන ලදී.

3) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් ගරු සභාපතිතුමාගේ 2021 වර්ෂයේ රු:150000.00 සංශෝධිත යෝජනාව යටතේ ප්‍රදේශයේ අඩු ආදායම් ලාභින් හට වැසිකිලි ආධාර ලබා දීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදි.

**ගරු සභාපතිතුමාගේ රු:150000.00 සංශෝධිත යෝජනාව යටතේ ප්‍රදේශයේ අඩු ආදායම් ලාභින් හට වැසිකිලි ආධාර ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා දිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දිසානායක මැතිතුමා ස්ථිර කලේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් යෝජනා අංක 04 ට අදාළ ලිපිය ඉදිරිපත් කරන ලදී.

4) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල සති පොළ සංවර්ධනය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**මීගහකිවුල සති පොළ සංවර්ධනය කිරීම සඳහා සභා අනුමැතිය ලබා දිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා ස්ථිර කලේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මූලාසනයෙන් අවසරය ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා සභාව අමතමින් පිටමාරුව සතිපොල සංවර්ධනය කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

මීළගට මූලාසන සභාව අමතමින් යෝජනා අංක 05 ට අදාළ ලිපිය ඉදිරිපත් කරන ලදී.

5) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් සෞභාගය මං පෙත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියේ වැඩ අවසන් නොකල ගිවිසුම් ගත මාර්ග සංවර්ධනය කිරිම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**සෞභාගය මං පෙත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියේ වැඩ අවසන් නොකල ගිවිසුම් ගත මාර්ග සංවර්ධනය කිරිම සඳහා සභා අනුමැතිය ලබා දිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා ස්ථිර කලේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් යෝජනා අංක 06 ට අදාළ ලිපිය ඉදිරිපත් කරන ලදී.

6) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(2) වගන්ති ප්‍රකාරව 2021 වර්ෂය සඳහා කමිටු පත් කිරීම හා කමිටු සඳහා බලය පැවරීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

- මුදල් හා ප්‍රතිපත්ති කමිටුව
  - ✓ කමිටුවේ සාමාජිකයින් සංඛ්‍යාව 5කි.
  - ✓ කමිටුවේ සභාපති ධූරය ගරු සභාපතිතුමා විසින් දරණු ලැබේ.
  - ✓ බලතල-:
    - ලක්ෂ 02 වඩා අඩු වවුචර්පත් අනුමත කිරීමේ බලය සභාපතිවරයා සතුය.
    - ලක්ෂ 02 වඩා වැඩි වවුචර්පත් අනුමත කිරීමේ බලය මුදල් කමිටුව සතුය.

**මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයන් ලෙස පහත සඳහන් ගරු මන්ත්‍රීවරු පත් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දිසානායක මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කළේය.**

<u>මුදල් හා ප්‍රතිපත්ති කමිටුව</u>

01. සභාපති - ගරු සභාපති එස්.එම්.එල්.එච්. ජයවර්ධන මැතිතුමා
02. සාමාජික -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුමතිපාල උඩලකුඹුර මැතිතුමා
03. සාමාජික -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා

04. සාමාජික -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිශාදි ශිරන්තිකා මැතිණිය
05. සාමාජික -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

- තාක්ෂණික කමිටුව
  - ✓ කමිටුවේ සාමාජිකයින් සංඛ්‍යාව 5කි.
  - ✓ කමිටුවේ සභාපති ධූරය ගරු සභාපතිතුමා විසින් දරණු ලැබේ.
  - ✓ බලතල-:
    - ප්‍රදේශයේ සියළු සංවර්ධන යෝජනා වල ක්ෂේත්‍ර පරීක්ෂා,සංවර්ධනය ඇගයීම සම්බන්ධ සියළු රාජකාරී කටයුතු.

**තාක්ෂණික කමිටුවේ සාමාජිකයන් ලෙස පහත සඳහන් ගරු මන්ත්‍රීවරු පත් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කළේය.**

<u>තාක්ෂණික කමිටුව</u>

01. සභාපති - ගරු සභාපති එස්.එම්.එල්.එච්. ජයවර්ධන මැතිතුමා
02. සාමාජික -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුමතිපාල උඩලකුඹුර මැතිතුමා
03. සාමාජික -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා
04. සාමාජික -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා
05. සාමාජික -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.බාලසුන්දරම් මැතිතුමා

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

- ටෙන්ඩර් කමිටුව
  - ✓ කමිටුවේ සාමාජිකයින් සංඛ්‍යාව 3කි.
  - ✓ කමිටුවේ සභාපති ධූරය ගරු සභාපතිතුමා විසින් දරණු ලැබේ.
  - ✓ බලතල-:
    - ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ සියළු රාජකාරී කටයුතු.

**ටෙන්ඩර් කමිටුවේ සාමාජිකයන් ලෙස පහත සඳහන් ගරු මන්ත්‍රීවරු පත් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුමතිපාල උඩලකුඹුර මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කළේය.**

<u>ටෙන්ඩර් කමිටුව</u>

01. සභාපති - ගරු සභාපති එස්.එම්.එල්.එච්. ජයවර්ධන මැතිතුමා
02. සාමාජික - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා
03. සාමාජික - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිශාදි ශිරන්තිකා මැතිණිය

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

- පරිසර හා පහසුකම් කමිටුව
  - ✓ කමිටුවේ සාමාජිකයින් සංඛ්‍යාව 5කි.
  - ✓ කමිටුවේ සභාපති ධූරය ගරු සභාපතිතුමා විසින් දරණු ලැබේ.

- ✓ බලතල-:
    - ප්‍රදේශයේ පරිසරය සම්බන්ධ සියළු රාජකාරී කටයුතු.

**පරිසර හා පහසුකම් කමිටුවේ සාමාජිකයන් ලෙස පහත සඳහන් ගරු මන්ත්‍රීවරු පත් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කළේය.**

<u>පරිසර හා පහසුකම් කමිටුව</u>

01. සභාපති - ගරු සභාපති එස්.එම්.එල්.එච්. ජයවර්ධන මැතිතුමා
02. සාමාජික - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එන්.එම්.නන්දන සම්පත් උදය කුමාර මැතිතුමා
03. සාමාජික - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා
04. සාමාජික - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා
04. සාමාජික - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

- ➢ නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව
    - ✓ කමිටුවේ සාමාජිකයින් සංඛ්‍යාව 5කි.
    - ✓ කමිටුවේ සභාපති ධූරය ගරු සභාපතිතුමා විසින් දරණු ලැබේ.
    - ✓ බලතල-:
        - ප්‍රදේශයේ නිවාස හා ප්‍රජා සංවර්ධනය සම්බන්ධ සියළු රාජකාරී කටයුතු.

**නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ සාමාජිකයන් ලෙස පහත සඳහන් ගරු මන්ත්‍රීවරු පත් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කළේය.**

<u>නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව</u>

01. සභාපති - ගරු සභාපති එස්.එම්.එල්.එච්. ජයවර්ධන මැතිතුමා
02. සාමාජික - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා
03. සාමාජික - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එන්.එම්.නන්දන සම්පත් උදය කුමාර මැතිතුමා
04. සාමාජික - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිශාදි ශිරන්තිකා මැතිණිය
05. සාමාජික - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.බාලසුන්දරම් මැතිතුමා

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

- ➢ ළමා හා කාන්තා කමිටුව
    - ✓ කමිටුවේ සාමාජිකයින් සංඛ්‍යාව 5කි.
    - ✓ කමිටුවේ සභාපති ධූරය ගරු සභාපතිතුමා විසින් දරණු ලැබේ.
    - ✓ බලතල-:
        - ප්‍රදේශයේ ළමා හා කාන්තා සම්බන්ධ සියළු රාජකාරී කටයුතු.

**ළමා හා කාන්තා කමිටුවේ සාමාජිකයන් ලෙස පහත සඳහන් ගරු මන්ත්‍රීවරු පත් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කළේය.**

ළමා හා කාන්තා කමිටුව

01. සභාපති - ගරු සභාපති එස්.එම්.එල්.එච්. ජයවර්ධන මැතිතුමා
02. සාමාජික - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.පත්මා කුමාරි මැතිණිය
03. සාමාජික - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ශ්‍රියාලතා මැතිණිය
04. සාමාජික - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිශාදි ශිරන්තිකා මැතිණිය
05. සාමාජික - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි සාමාවතී මැතිණිය

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මූලාසනය සභාව අමතමින් කාරක සභාව සභාවක් බවට පත් කිරීම සම්බන්ධ යෝජනාව සභාගත කරන ලදී.

**කාරක සභාව සභාවක් බවට පත් කිරීම සම්බන්ධ යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා ස්ථිර කළේය.**

මීළගට ගරු සභාපතිතුමා සභාව අමතා න්‍යායපත්‍රානුකූලව හදිසි යෝජනා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි.

<u>හදිසි යෝජනා</u>

මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 01 ඉදිරිපත් කරන ලදි.

> 01) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක වන විෂයයන් වලට අදාලව 1988 වර්ෂයේ සහ 2013 වර්ෂයේ ගැසට් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවන් වැළඳ ගැනීම සඳහා අදාල භාෂා පරිවර්තනයන් (ඉංග්‍රීසි/ දෙමළ භාෂා) සිදු කර ගෙවීම් කිරීම සඳහා සහ ගැසට් කිරීමට අවශ්‍ය සභා අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදි.

**මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක වන විෂයයන් වලට අදාලව 1988 වර්ෂයේ සහ 2013 වර්ෂයේ ගැසට් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවන් වැළඳ ගැනීම සඳහා අදාල භාෂා පරිවර්තනයන් (ඉංග්‍රීසි/ දෙමළ භාෂා) සිදු කර ගෙවීම් කිරීම සඳහා සහ ගැසට් කිරීමට අවශ්‍ය සභා අනුමැතිය ලබා දීම සඳහා සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා ස්ථිර කළේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 02 ඉදිරිපත් කරන ලදි.

> 02) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් තල්දෙන, 10 කණුව ලිපිනයෙහි පදිංචි ආර්.එම්.සුගතපාල මයා අයට පානීය ජල සම්බන්ධතාවයක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදි.

**තල්දෙන, 10 කණුව ලිපිනයෙහි පදිංචි ආර්.එම්.සුගතපාල මයා අයට පානීය ජල සම්බන්ධතාවයක් ලබා දීම සඳහා සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා ස්ථිර කළේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදි.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 03 ඉදිරිපත් කරන ලදි.

03) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.එස්.කේ.විජේකෝන් මැතිතුමාගේ රු:75000.00 මන්ත්‍රී ප්‍රතිපාදන යෝජනා සංශෝධනය කිරීම යටතේ දෙසැම්බර් මස සම්මත කරන ලද වැවතැන්න සුසාන භූමිය සංවර්ධනය කිරීම සඳහා රු:25000.00ක් සහ මීගස්පිටිය දහම් පාසල ද්‍රව්‍ය ආධාර ලබා දීම සඳහා රු:25000.00 යන යෝජනා වෙනුවට අල් ගෙදර ප්‍රජා ශාලාවට ද්‍රව්‍ය ආධාර ලබා දීම සඳහා රු:50000.00ක් යෝජනා සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධ යෝජනාව සභාගත කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.එස්.කේ.විජේකෝන් මැතිතුමාගේ රු:75000.00 මන්ත්‍රී ප්‍රතිපාදන යෝජනා සංශෝධනය කිරීම දෙසැම්බර් මස සම්මත කරන ලද වැවතැන්න සුසාන භූමිය සංවර්ධනය කිරීම සඳහා රු:25000.00ක් සහ මීගස්පිටිය දහම් පාසල ද්‍රව්‍ය ආධාර ලබා දීම සඳහා රු:25000.00 යන යෝජනා වෙනුවට අල් ගෙදර ප්‍රජා ශාලාවට ද්‍රව්‍ය ආධාර ලබා දීම සඳහා රු:50000.00ක් යෝජනා සඳහා සභා අනුමැතිය ලබා දීම සඳහා සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.එස්.කේ.විජේකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.පත්මා කුමාරි මැතිණිය ස්ථිර කළේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදි.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 04 ඉදිරිපත් කරන ලදි.

04) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් තල්දෙන,11කණුව,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා අරුකුඹුර ජල යෝජනා ක්‍රමයේ ජල සබඳතාවක් ලබා ගෙන තිබු අතර එම ජල සබඳතාවය දිනිදු නිවස,මීගස්පිටිය පාර,තල්දෙන හංදිය බදුල්ල යන ලිපිනයේ පදිංචි ජේ.එම්.දර්ශන ධර්මසේන යන අය නමට ලබා දීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**තල්දෙන,11කණුව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා අරුකුඹුර ජල යෝජනා ක්‍රමයේ ජල සබඳතාවක් ලබා ගෙන තිබු අතර එම ජල සබඳතාවය තමා විසින් ඉවත් කර ගන්නා ලද බවත් ඒ වෙනුවට දිනිදු නිවස,මීගස්පිටිය පාර,තල්දෙන හංදිය බදුල්ල යන ලිපිනයේ පදිංචි ජේ.එම්.දර්ශන ධර්මසේන මයා යන අයට නව සබඳතාවක් ලෙස ලබා දිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.එස්.කේ.විජේකෝන් මැතිතුමා ස්ථිර කළේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වු බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 05 ඉදිරිපත් කරන ලදි.

05) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් UPPF-5485 නිළ කැබ් රථය සඳහා 2021 දෙසැම්බර් මස 163L අමතර ඉන්ධන අනුමැතිය ලබාගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදි.

**මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් UPPF-5485 නිළ කැබ් රථය සඳහා 2021 දෙසැම්බර් මස 163L අමතර ඉන්ධන අනුමැතිය ලබාදීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.එස්.කේ.විජේකෝන් මැතිතුමා ස්ථිර කළේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 06 ඉදිරිපත් කරන ලදි.

06) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් මීගහකිවුල සති පොල 2021 වර්ෂයට බදු දීමේදි කොරෝනා වසංගතය හේතුවෙන් ඇඳිරි නීති සමයේ පොල පැවැත්වීමට නොහැකි බව සති පොල බදුගැණුම්කරු වන වයි.එම්.රමණි පුෂ්පකුමාරි යාපා මිය විසින් ලිපියකින් දැනුම් දුන් අතර , ඒ අනුව ලොග් සටහන් පොත අනුව නිරෝධායන ඇඳිරි නීති දිනයන් අනුව කපා හැරිය යුතු ආදායම් මුදල රු:853416.64ක බදු මුදල් කපා හැරීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් මීගහකිවුල සති පොල 2021 වර්ෂයට බදු දීමේදි කොරෝනා වසංගතය හේතුවෙන් ඇඳිරි නීති සමයේ පොල පැවැත්වීමට නොහැකි වූ කාල සීමාව සඳහා කපා හැරිය යුතු ආදායම් මුදල රු:853416.64ක බදු මුදල් කපා හැරීම සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.එස්.කේ.විජේකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා ස්ථිර කළේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 07 ඉදිරිපත් කරන ලදි.

07) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් මීගහකිවුල සති පොල 2005 වර්ෂෙයදී පොල බදු ගෙන තිබූ බදු ගැණුම්කරු වූ වසන්ත ජයකොඩි මහතා මියගොස් ඇති බැවින් ඔහුගෙන් පොල බදු ලෙස මෙතෙක් අය කර ගැනීමට නොහැකි වීම නිසා විගණන නිලධාරි මහතුන් විසින් අදාල මුදල ගරු සභාවේ අනුමැතිය ලබා ගෙන 2021 ගිණුම් වලින් කපා හැරිම සඳහා ලබා දුන් උපදෙස් අනුව මීගහකිවුල පොදු පහසුතා මධ්‍යස්ථානයෙද 2017 සිට හිඟ ලෙස දීර්ඝ කාලීනව මේ දක්වා ඉදිරියට ගෙන එන මුදල කපා හැරීම සම්බන්ධ ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධ යෝජනාව සභාගත කරන ලදි.

**මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් මීගහකිවුල සති පොල 2005 වර්ෂෙයදී පොල බදු ගෙන තිබූ බදු ගැණුම්කරු වූ වසන්ත ජයකොඩි මහතාගේ මරණ සහතිකය සමඟ අවශ්‍ය ලිපි ලේඛන පළාත් පාලනයට යවා අවශ්‍ය උපදෙස් ලබා ගන්නා ලෙසද ,එසේම මීගහකිවුල පොදු පහසුතා මධ්‍යස්ථානයේ 2017 සිට හිඟ ලෙස දීර්ඝ කාලීනව මේ දක්වා ඉදිරියට ගෙන ආ මුදල නොකපා ආදාල පුද්ගලයාගෙන් අය කර ගැනීමට සභාවේ ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 08 ඉදිරිපත් කරන ලදි.

08) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් කරමැටිය සතිපොල පැවැත්වෙන දිනය වෙනස් කිරීම සම්බන්ධ ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධ යෝජනාව සභාගත කරන ලදි.

**මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් කරමැටිය සතිපොල පැවැත්වෙන දිනය වෙනස් කිරීම සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.පත්මා කුමාරි මැතිණිය ස්ථිර කළේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වු බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 09 ඉදිරිපත් කරන ලදි.

09) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුමතිපාල උඩලකුඹුර මැතිතුමාගේ රු:75000.00 මන්ත්‍රී ප්‍රතිපාදන යෝජනාව යටතේ ඉතුරුව තිබෙන රු:10000.00ක ද්‍රව්‍යාධාර ලබා දීමට තල්දෙන,ගොන්කටුතැන්න, දිරිය සුභ සාධක සමිතිය සඳහා පෝසිලේන් පිඟන් ලබා දීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධ යෝජනාව සභාගත කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුමතිපාල උඩලකුඹුර මැතිතුමාගේ රු:75000.00 මන්ත්‍රී ප්‍රතිපාදන යෝජනාව යටතේ ඉතුරුව තිබෙන රු:10000.00ක ද්‍රව්‍යාධාර ලබා දීමට තල්දෙන,ගොන්කටුතැන්න, දිරිය සුභ සාධක සමිතිය සඳහා පෝසිලේන් පිඟන් ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුමතිපාල උඩලකුඹුර මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.එස්.කේ.විජේකෝන් මැතිතුමා ස්ථිර කළේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වු බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 10 ඉදිරිපත් කරන ලදි.

10) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.චමින්ද ප්‍රදීප් මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ රුපියල් 75,000 ක යෝජනාව. ආර්.එම්.සුනේත්‍රා දීපානී,වැලිකඩේවත්ත, බතලවත්ත, තල්දෙන,බදුල්ල රු:25,000/=ක සිමෙන්ති ආධාර ලබා දීම , ටී.පී.ලලිතා අමරංගනී,අංක 01,බතලවත්ත,තල්දෙන,බදුල්ල රු:25,000/=ක සිමෙන්ති ආධාර ලබා දීම ,එච්.සමීර චතුරංග පෙරේරා,නිමාෂා නිවස,බතලවත්ත,තල්දෙන,බදුල්ල රු:25,000/=ක සිමෙන්ති ආධාර ලබා දීම සම්බන්ධ ද්‍රව්‍යාධාර ලබා දීමේ යෝජනාව සභා ගත කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.චමින්ද ප්‍රදීප් මැතිතුමා විසින් රුපියල් 75,000 ක ප්‍රතිපාදන යටතේ ආර්.එම්.සුනේත්‍රා දීපානී,වැලිකඩේවත්ත, බතලවත්ත, තල්දෙන,බදුල්ල රු:25,000/=ක සිමෙන්ති ආධාර ලබා දීම , ටී.පී.ලලිතා අමරංගනී,අංක 01,බතලවත්ත,තල්දෙන,බදුල්ල රු:25,000/=ක සිමෙන්ති ආධාර ලබා දීම ,එච්.සමීර චතුරංග පෙරේරා,නිමාෂා නිවස,බතලවත්ත,තල්දෙන,බදුල්ල රු:25,000/=ක සිමෙන්ති ආධාර ලබා දීම සුදුසු බව යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා ස්ථිර කළේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළඟට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 11 ඉදිරිපත් කරන ලදී.

11) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ශ්‍රියාලතා මැතිණිය ප්‍රතිපාදන යටතේ රුපියල් 75,000 ක යෝජනාව. බලගොල්ල, 18 කණුව, ගිලබැන්දයාය, ඩී.එම්.සෝමාවතී හට සිමෙන්ති ආධාර ලබා දීම ,එච්.ඩී.එම්.අනුෂා දමයන්ති ,16 කණුව , කොළොන්කැටිය, මීගහකිවුල සිමෙන්ති ආධාර ලබා දීම , එක්සත් සුභ සාධක හා මරණාධාර සමිතිය ,හෙලමල්වත්ත ,මීගහකිවුල වානේ මධ්‍යම අල්මාරි 01, දම්රෝ මේස 01ක ද්‍රව්‍යාධාර ලබා දීම , මීගහකිවුල,බලගොල්ල, එක්සත් සුභසාධන හා අවමංගල්‍යාධාර සමිතිය සඳහා බුජේ සෙට් ලීටර් 7 සෙට් 01ක් , ලීටර් 6 සෙට් 01ක් ,ලීටර් 5 සෙට් 01ක්, ලීටර් 4 සෙට් 01ක් ලබා දීම සම්බන්ධ ද්‍රව්‍යාධාර ලබා දීමේ යෝජනාව සභා ගත කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ශ්‍රියාලතා මැතිණිය විසින් රුපියල් 75,000 ක ප්‍රතිපාදන යටතේ බලගොල්ල, 18 කණුව, ගිලබැන්දයාය, ඩී.එම්.සෝමාවතී හට සිමෙන්ති ආධාර ලබා දීම ,එච්.ඩී.එම්.අනුෂා දමයන්ති ,16 කණුව , කොළොන්කැටිය, මීගහකිවුල සිමෙන්ති ආධාර ලබා දීම , එක්සත් සුභ සාධක හා මරණාධාර සමිතිය ,හෙලමල්වත්ත ,මීගහකිවුල වානේ මධ්‍යම අල්මාරි 01, දම්රෝ මේස 01ක ද්‍රව්‍යාධාර ලබා දීම එක්සත් සුභසාධන හා අවමංගල්‍යාධාර සමිතිය සඳහා බුජේ සෙට් ලීටර් 7 සෙට් 01ක් , ලීටර් 6 සෙට් 01ක් ,ලීටර් 5 සෙට් 01ක්, ලීටර් 4 සෙට් 01ක් ලබා දීම සුදුසු බවට යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා ස්ථිර කළේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළඟට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 12 ඉදිරිපත් කරන ලදී.

12) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් පළාත් පාලන දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් 6984 ටිපර් රථයේ ක්ලච් ප්ලේට් යෙදීම , RD 6200 ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීම , 9389 ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීම , RB 9997 ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීම , 270-1735 ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම යෝජනාව සභා ගත කරන ලදී.

**පළාත් පාලන දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් 6984 ටිපර් රථයේ ක්ලච් ප්ලේට් යෙදීම , RD 6200 ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීම , 9389 ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීම , RB 9997 ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීම , 270-1735 ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා සභාපති එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා ස්ථිර කළේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළඟට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 13 ඉදිරිපත් කරන ලදී.

13) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් එස්.එච්.එල්.වයි.ටී.ටී.ඉසුරු පැතුම් මයා , තල්දෙන ක්ෂේත්‍රයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක හට 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත හා එයට අදාළ සංශෝධන ,1862 අංක 15 දරණ පීඩන ක්‍රියා ආඥා පනත හා එයට අදාළ සංශෝධන ,1915 අංක 19 දරණ නිවාස හා නගර සංවර්ධන ආඥා පනත එයට ආදාළ සංශෝධන ,සුසාන භූමි ආඥා පනත එයට ආදාළ සංශෝධන ,ගෝසාතන ආඥා පනත හා එයට ආදාළ සංශෝධන යන පනත් වල බලය ලත් නිලධාරියා ලෙස නම් කිරීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය සභා ගත කරන ලදී.

**එස්.එච්.එල්.වයි.ටී.ටී.ඉසුරු පැතුම් මයා , තල්දෙන ක්ෂේත්‍රයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක හට 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත හා එයට අදාළ සංශෝධන ,1862 අංක 15 දරණ පීඩන ක්‍රියා ආඥා පනත හා එයට අදාළ සංශෝධන ,1915 අංක 19 දරණ නිවාස හා නගර සංවර්ධන ආඥා පනත එයට ආදාළ සංශෝධන ,සුසාන භූමි ආඥා පනත එයට ආදාළ සංශෝධන ,ගෝසාතන ආඥා පනත හා එයට ආදාළ සංශෝධන යන පනත් වල බලය ලත් නිලධාරියා ලෙස නම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.එස්.කේ.විජේකෝන් මැතිතුමා ස්ථිර කළේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මූලාසන සභාව අමතමින් මීළගට න්‍යායපත්‍රානුකූලව කාරක සභා වාර්තා සලකා බැලීම සම්බන්ධයෙන් 2022.01.20 වන දින මුදල් කමිටු වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි.

## 2022/01/20 දින මීගහකිවුල ප්‍රාදේශීය සභාවේදී පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව

2022/01/20 වන දින පෙ.ව.10.00ට ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු මන්ත්‍රී ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා,ගරු මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා,ලේකම්තුමිය හා විෂය නිළධාරී පිළිගනිමින් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව ආරම්භ කරන ලදී.

මීළඟට න්‍යාය පත්‍රාණුකූලව ගරු සභාපතිතුමා විසින් 2021.12.24 දිනැති පසුගිය රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරන ලදී.පසුගිය රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා ස්ථිර කළේය.

න්‍යාය පත්‍රාණුකූලව දිනට නියමිත කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් පළමු කරුණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.ඒ අනුව 2021 දෙසැම්බර් මස ආදායම් වියදම් හා ඉන්ධන වාර්තා කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කළ අතර 2021 වර්ෂයේ දෙසැම්බර් මස ආදායම් වියදම් හා ඉන්ධන වාර්තා අනුමත කිරීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

කරමැටිය සතිපොළ බදාදා දින පැවැත්වීම හේතුවෙන් එදිනට මැලිබන් ගාමන්ට් හි සේවයෙහි නියුතු අය සඳහා භාණ්ඩ මිලදි ගැනීමේ අවස්ථාව නොමැති නිසා භාණ්ඩ මිලදී ගැනීම ඉරිදා දින පැවැත්වීම සඳහා වෙළෙන්දන් වෙත ඉල්ලීම් කර ඇති අතර ඒ අනුව ඉරිදා දින පැවැත්වීමට තුලින් එම අයට සහ සභාවට වැඩි ආදායමක් උත්පාදනය කර ගත හැකි බැවින් ඉරිදා දිනට වෙනස් කිරීම සඳහා ඉල්ලීම් කරන ලද බවත් ඒ අනුව බදාදා දින පැවැත්වෙන සති පොල ඉරිදා දින පැවැත්වීමට කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

පසුගිය සභා රැස්වීමේදී මීගහකිවුල නගරයේ කැලි කසල එකතු කිරීමේදී කසල බද්දක් අය කිරිම සඳහා සම්මත අතුරු ව්‍යවස්ථාවට අනුව කසල බද්දක් අය කිරිම සඳහා කඩ වර්ගීකරණය කර වාර්ෂිකව රු:6000.00, රු:5000.00,රු:3000.00,රු:2000.00,රු:1000.00 ලෙස අය කර ගැනීම සඳහා කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

දිනට නියමිත කරුණු අවසන් බැවින් හා සාකච්ඡා කිරීමට වෙනත් කාරණා නොමැති බැවින් ගරු සභාපතිතුමාගේ ස්තූති කතාවෙන් අනතුරුව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව පෙ.ව.10.00ට අවසන් කරන ලදී.

මුලාසනය සභාව අමතමින් මීළගට න්‍යාය පත්‍රාණුකූලව 2021 දෙසැම්බර් මස ආදායම්,වියදම් වාර්තා හා සභාවේ වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තා සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

## මාසික ලැබීම් සාරාංශය

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

**මාසය - 2021 දෙසැම්බර්**

| ආදායම් ශීර්ෂය | ආදායම් ප්‍රභවය | මුදල (රු) |
|---|---|---|
| 1/71 | වැටුප් ප්‍රතිපූර්ණය | 1,728,263.29 |
| 1/71 | මන්ත්‍රී දීමනා | 270,000.00 |
| 1/13 | ව්‍යාපාර බදු | 19,600.00 |
| 1/62 | පෝරම ගාස්තු | 525.00 |
| 1/41 | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම | 14,000.00 |
| 1/43 | ඉඩම් ගොඩනැගිලි පෙරසැරි ගාස්තු | 13,380.00 |
| 1/44 | වීථි රේඛා හා නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම | 18,100.00 |
| 1/47 | වාහන නවතා තැබිමේ ගාස්තු | 10,250.00 |
| 1/63 | මුද්දර ගාස්තු | 625,165.00 |
| 1 | සේවක ණය | 2,500.00 |
| 1 | තැන්පත් | 11,410.00 |
| 2/23 | පොදු පහසුතා මධ්‍යස්ථානය | 11,780.00 |
| 2/31 | බලපත්‍ර ගාස්තු | 16,770.00 |
| 2/62 | පෝරම ගාස්තු | 150.00 |
| 2 | තැන්පත් (වෙළඳ බලපත්‍ර) | 1,375.00 |
| 3/22 | තාවකාලික කඩ ලැබීම් | 8,950.00 |
| 3/21 | සභාව සතු ඉඩම් හා කුළී ((තල්දෙන උප තැපැල් කාර්යාලය) | 1,200.00 |
| | | |

| | | |
|---|---|---|
| 3/23 | ටෙන්ඩර් කඩ කුලී | 70,300.00 |
| 3/81 | කර්මාන්ත ලැබීම් | 384,502.78 |
| 4/14 | ජල ලැබීම් | 121,693.00 |
| 4/41 | නව ජල සම්බන්ධතා ගාස්තු | 10,000.00 |
| 6/15 | සභාව සතු ඉඩම් හා කුළී (පිටමාරුව පුංචි ලෝකාන්තය) | 28,150.00 |
| 6/52 | පුස්තකාල දඩ | 1,425.00 |
| 6/62 | අබලි ද්‍රව්‍ය විකිණීම /පුස්තකාල පෝරම ගාස්තු/පෙර පාසල් අයදුම්පත් ගාස්තු | 200.00 |
| 6 | තැන්පත් (පුස්තකාල තැන්පත් ගාස්තු/පිටමාරුව පුංචි ලෝකාන්තය 30% කොමිස් ගාස්තු) | 11,850.00 |
| 5/23 | සතිපොළ ගාස්තු ලැබීම් | 20,890.00 |
| 173 | අත්තිකාරම් පියවීම | 285.00 |
| වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට දීම | | |
| 1/45 | ට්‍රැක්ටරය කුළියට දීම | 2,500.00 |
| 1/46 | බවුසරය කුලියට දීම | 9,000.00 |
| 3/43 | ටොන් 2 ගල්රෝල කුලියට දීම | 1,750.00 |
| 3/43 | ටිපර් රථය කුළියට දීම | 10,000.00 |
| එකතුව | | **3,425,964.07** |

## 2021දෙසැම්බර් මස ගෙවීම් විස්තරය

| අනු අංකය | ගෙවන ලද දිනය | ගෙවීම්ලාභී නම හා විස්තරය | මුදල (රු) |
|---|---|---|---|
| 1 | 2021.12.06 | සභා ලේකම්, ප්‍රාදේශිය සභාව, මීගහකිවුල - සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය | 4,985.00 |
| 2 | 2021.12.06 | එම්.එස්.කේ.මහානායක මයා, ආදායම් පරීක්ෂක - ක්ෂේත්‍රයේ මුදල් අය කිරීමේ රාජකාරි වල නිරත විම වෙනුවෙන් සංයුක්ත දීමනා ගෙවිම - 2021 අප්‍රේල් මස | 2,500.00 |
| 3 | 2021.12.06 | එම්.එස්.කේ.මහානායක මයා, ආදායම් පරීක්ෂක - ක්ෂේත්‍රයේ මුදල් අය කිරීමේ රාජකාරි වල නිරත විම වෙනුවෙන් සංයුක්ත දීමනා ගෙවිම - 2021 ජුලි මස | 2,500.00 |
| 4 | 2021.12.06 | එස්.එම්.ඒකනායක මයා, ආදායම් පරීක්ෂක - ක්ෂේත්‍රයේ මුදල් අය කිරීමේ රාජකාරි වල නිරත විම වෙනුවෙන් සංයුක්ත දීමනා ගෙවිම - 2021 ජුලි මස | 2,500.00 |
| 5 | 2021.12.06 | එස්.එම්.ඒකනායක මයා, ආදායම් පරීක්ෂක - ක්ෂේත්‍රයේ මුදල් අය කිරීමේ රාජකාරි වල නිරත විම වෙනුවෙන් සංයුක්ත දීමනා ගෙවිම - 2021 ඔක්තෝබර් මස | 2,500.00 |
| 6 | 2021.12.06 | කළමනාකරු, සී/ස ඌව පළාත් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය, බදුල්ල- ඒ4 පැකට් 25ක් හා ලීගල් කොළ පැකට් 01 මිලදිගැනිම වෙනුවෙන් ගෙවිම | 22,250.00 |
| 7 | 2021.12.09 | කළමනාකරු, හේෂාන් ඉංජිනියරින් වර්ක්ස්, මීගහකිවුල - UPPF 5485 කැබ් රථය අලුත්වැඩියාව සඳහා ගෙවිම | 3,200.00 |

| | | | |
|---|---|---|---|
| 8 | 2021.12.09 | එම්.ඩී.කේ.සී.ගුණතිලක මහත්මිය, සභා ලේකම් - ක්ෂේත්‍ර රාජකාරි වල නිරතවීම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම | 1,000.00 |
| 9 | 2021.12.09 | එම්.ඩී.කේ.සී.ගුණතිලක මහත්මිය, සභා ලේකම් - ක්ෂේත්‍ර රාජකාරි වල නිරතවීම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම | 2,000.00 |
| 10 | 2021.12.09 | එල්.සී.බෝගහවත්ත මහතා, යන්ත්‍ර ක්‍රියාකරු - ටොන් 8 ගල්රෝලේ ක්ෂේත්‍රයේ වැඩ කිරිම වෙනුවෙන් සංයුක්ත දීමනාවක් ගෙවීම - ජූලි මස | 3,500.00 |
| 11 | 2021.12.09 | එල්.සී.බෝගහවත්ත මහතා, යන්ත්‍ර ක්‍රියාකරු - ටොන් 8 ගල්රෝලේ ක්ෂේත්‍රයේ වැඩ කිරිම වෙනුවෙන් සංයුක්ත දීමනාවක් ගෙවීම - ජූනිමස | 3,500.00 |
| 12 | 2021.12.09 | එල්.සී.බෝගහවත්ත මහතා, යන්ත්‍ර ක්‍රියාකරු - ටොන් 8 ගල්රෝලේ ක්ෂේත්‍රයේ වැඩ කිරිම වෙනුවෙන් සංයුක්ත දීමනාවක් ගෙවීම - මැයි මස | 3,500.00 |
| 13 | 2021.12.09 | එල්.සී.බෝගහවත්ත මහතා, යන්ත්‍ර ක්‍රියාකරු - ටොන් 8 ගල්රෝලේ ක්ෂේත්‍රයේ වැඩ කිරිම වෙනුවෙන් සංයුක්ත දීමනාවක් ගෙවීම - අගෝස්තු මස | 3,500.00 |
| 14 | 2021.12.09 | ඩබ්.එම්.ඩී.සුරමාලතා මහත්මිය,DarlyButter Hotel & Guest, මීගහකිවුල - කණ්ඩායම් පරීක්ෂණයට පැමිණි නිලධාරින් හට දිවා ආහාරය ලබාදිම වෙනුවෙන් ගෙවීම | 7,900.00 |
| 15 | 2021.12.09 | කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින්ගේ නොවැම්බර් මස වැටුප් ගෙවීම | 87,970.00 |
| 16 | 2021.12.09 | ආදේශක පදනම මත සේවය කරන සේවකයින්ගේ නොවැම්බර් මස වැටුප් ගෙවීම | 80,110.64 |
| 17 | 2021.12.09 | ඩබ්.එම්.ජයලත් මහතා, ගරු සභාපතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම් රාජකාරි කිරීම වෙනුවෙන් නොවැම්බර් මස දීමනා ගෙවීම | 10,000.00 |
| 18 | 2021.12.14 | එම්.කේ.දයාවංශ මහතා, වටගොම්මන, පිටමාරුව - පිටමාරුව පොල ශුද්ධ පවිත්‍ර කිරීමේ වෙනුවෙන් දීමනා ගෙවීම - ජූලි/අගෝස්තු/සැප්තැම්බර්/ඔක්තෝබර්/නොවැම්බර් යන මාසයන්හි | 11,000.00 |
| 19 | 2021.12.14 | ලංකාවේ සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, බදුල්ල - 2022 වර්ෂයේ අයවැය සැකසීමේදී අවශ්‍ය සංවර්ධන යෝජනා ලබාගැනිමට පළ කරන ලද පුවත්පත් දැන්වීම සඳහා ගෙවීම් කිරීම | 19,440.00 |
| 20 | 2021.12.14 | ලංකාවේ සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, බදුල්ල - 2022 වර්ෂයේ අයවැය කෙටුම්පත පරීක්ෂා කර බැලීම සම්බන්ධයෙන් පළ කරන ලද පුවත්පත් දැන්වීම සඳහා ගෙවීම් කිරීම | 28,674.00 |
| 21 | 2021.12.14 | විගණකාධිපතිගේ ලංකා බැංකුවේ බත්තරමුල්ල ශාඛාවේ අංක 7040064 දරණ නිල ගිණුමට බැර- 2020 වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 49,800.00 |
| 23 | 2021.12.17 | ටී.වසන්ති මහත්මිය, වර්ණසූරිය ඔටෝ සර්විස් හා මෝටර් ගරාජ්, මීගහකිවුල - UPPF 5485 කැබ් රථයේ වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 17,545.00 |
| 24 | 2021.12.17 | ටී.වසන්ති මහත්මිය, වර්ණසූරිය ඔටෝ සර්විස් හා මෝටර් ගරාජ්, මීගහකිවුල - WPZA 5003 බැකෝ යන්ත්‍රය සඳහා ග්‍රීස් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 13,500.00 |

| | | | |
|---|---|---|---|
| 25 | 2021.12.17 | ඩී.එම්.සංජීව නුවන් මයා, දෛනික වැටුප් පදනම මත සේවය කරන රියදුරු සඳහා නොවැම්බර් මස ඉටුකළ සේවා වෙනුවෙන් ගෙවීම් කිරීම | 11,751.63 |
| 26 | 2021.12.20 | කළමනාකරු, රත්න සුපර් සිටි, මීගහකිවුල - RX 1456 බවුසර් රථයට අවශ්‍ය ජල මෝටරය මිලදිගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 48,000.00 |
| 27 | 2021.12.20 | කළමනාකරු, ගංගා මෝටර්ස්, පදියතලාව, මහියංගණය - RX 1456 බවුසර් රථයට අවශ්‍ය ග්‍රීන් හෝස් මිලදිගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 16,500.00 |
| 28 | 2021.12.20 | සහකාර වාණිජ්‍ය අධිකාරි, ශ්‍රී ලංකා ටෙලිකොම්, බදුල්ල - 055 - 2245890 දුරකථනයේ සැප්තැම්බර් මස බිල්පත පියවීම | 2,609.11 |
| 29 | 2021.12.20 | සහකාර වාණිජ්‍ය අධිකාරි, ශ්‍රී ලංකා ටෙලිකොම්, බදුල්ල - 055 - 2245775 දුරකථනයේ සැප්තැම්බර් මස බිල්පත පියවීම | 3,151.16 |
| 30 | 2021.12.20 | සහකාර වාණිජ්‍ය අධිකාරි, ශ්‍රී ලංකා ටෙලිකොම්, බදුල්ල - 055 - 2245890 දුරකථනයේ අගෝස්තු මස බිල්පත පියවීම | 2,473.51 |
| 31 | 2021.12.20 | සහකාර වාණිජ්‍ය අධිකාරි, ශ්‍රී ලංකා ටෙලිකොම්, බදුල්ල - 055 - 2245775 දුරකථනයේ අගොස්තු මස බිල්පත පියවීම | 3,073.66 |
| 32 | 2021.12.20 | සහකාර වාණිජ්‍ය අධිකාරි, ශ්‍රී ලංකා ටෙලිකොම්, බදුල්ල - 055 - 2245890 දුරකථනයේ ඔක්තෝබර් මස බිල්පත පියවීම | 2,403.51 |
| 33 | 2021.12.20 | සහකාර වාණිජ්‍ය අධිකාරි, ශ්‍රී ලංකා ටෙලිකොම්, බදුල්ල - 055 - 2245890 දුරකථනයේ නොවැම්බර් මස බිල්පත පියවීම | 2,548.66 |
| 34 | 2021.12.20 | සහකාර වාණිජ්‍ය අධිකාරි, ශ්‍රී ලංකා ටෙලිකොම්, බදුල්ල - 055 - 2245775 දුරකථනයේ ඔක්තෝම්බර් මස බිල්පත පියවීම | 3,867.52 |
| 35 | 2021.12.20 | සහකාර වාණිජ්‍ය අධිකාරි, ශ්‍රී ලංකා ටෙලිකොම්, බදුල්ල - 055 - 2245775 දුරකථනයේ නොවැම්බර් මස බිල්පත පියවීම | 3,406.54 |
| 36 | 2021.12.20 | සහකාර වාණිජ්‍ය අධිකාරි, ශ්‍රී ලංකා ටෙලිකොම්, බදුල්ල - 055 - 2245890 දුරකථනයේ ජූලි මස බිල්පත පියවීම | 1,114.04 |
| 37 | 2021.12.20 | සහකාර වාණිජ්‍ය අධිකාරි, ශ්‍රී ලංකා ටෙලිකොම්, බදුල්ල - 055 - 2245775 දුරකථනයේ ජූලි මස බිල්පත පියවීම | 3,116.88 |
| 38 | 2021.12.20 | කළමනාකරු, මොබිටෙල් පුද්ගලික සමාගම, කොළඹ 03 - ESMS බිල්පත පියවීම - ඔක්තෝබර් මස | 61.30 |
| 39 | 2021.12.20 | කළමනාකරු, මොබිටෙල් පුද්ගලික සමාගම, කොළඹ 03 - ESMS බිල්පත පියවීම - නොවැම්බර් මස | 61.30 |
| 40 | 2021.12.20 | කළමනාකරු, මොබිටෙල් පුද්ගලික සමාගම, කොළඹ 03 - ESMS බිල්පත පියවීම - සැප්තැම්බර් මස | 61.30 |
| 41 | 2021.12.20 | ආදායම් ගණකාධිකාරි (ඌව), ලංකා විදුලි බල මණ්ඩලය, බදුල්ල - විපීලාම්පු ජූලි මස විදුලි බිල්පත පියවීම | 1,758.90 |
| 42 | 2021.12.20 | ආදායම් ගණකාධිකාරි (ඌව), ලංකා විදුලි බල මණ්ඩලය, බදුල්ල - පිටමාරුව මහජන පුස්තකාලයේ ජූලි මස විදුලි බිල්පත පියවීම | 276.60 |
| 43 | 2021.12.20 | ආදායම් ගණකාධිකාරි (ඌව), ලංකා විදුලි බල මණ්ඩලය, බදුල්ල - පැරණි කාර්යාලයේ ජූලි මස විදුලි බිල්පත පියවීම | 770.70 |
| 44 | 2021.12.20 | ආදායම් ගණකාධිකාරි (ඌව), ලංකා විදුලි බල මණ්ඩලය, බදුල්ල - විපීලාම්පු ඔක්තෝබර් මස විදුලි බිල්පත පියවීම | 1,813.80 |
| 45 | 2021.12.20 | ආදායම් ගණකාධිකාරි (ඌව), ලංකා විදුලි බල මණ්ඩලය, බදුල්ල -බස් නැවතුම්පොල ඔක්තෝබර් මස විදුලි බිල්පත පියවීම | 423.00 |

| | | | |
|---|---|---|---|
| 46 | 2021.12.20 | ආදායම් ගණකාධිකාරි (ඌව), ලංකා විදුලි බල මණ්ඩලය, බදුල්ල - පැරණි කාර්යාලයේ සැප්තැම්බර් මස විදුලි බිල්පත පියවීම | 789.00 |
| 47 | 2021.12.20 | ආදායම් ගණකාධිකාරි (ඌව), ලංකා විදුලි බල මණ්ඩලය, බදුල්ල - පැරණි කාර්යාලයේ ඔක්තෝබර් මස විදුලි බිල්පත පියවීම | 972.00 |
| 48 | 2021.12.20 | ආදායම් ගණකාධිකාරි (ඌව), ලංකා විදුලි බල මණ්ඩලය, බදුල්ල -නව කාර්යාල ගොඩනැගිල්ලේ ඔක්තෝබර් මස විදුලි බිල්පත පියවීම | 2,856.90 |
| 49 | 2021.12.20 | ආදායම් ගණකාධිකාරි (ඌව), ලංකා විදුලි බල මණ්ඩලය, බදුල්ල - මීගහකිවුල ජල පොම්පාගාරයේ ඔක්තෝබර් මස විදුලි බිල්පත පියවීම | 7,261.20 |
| 50 | 2021.12.20 | ආදායම් ගණකාධිකාරි (ඌව), ලංකා විදුලි බල මණ්ඩලය, බදුල්ල - තල්දෙන ජල පොම්පාගාරයේ ඔක්තෝබර් මස විදුලි බිල්පත පියවීම | 924.00 |
| 51 | 2021.12.20 | ආදායම් ගණකාධිකාරි (ඌව), ලංකා විදුලි බල මණ්ඩලය, බදුල්ල - පිටමාරුව පුස්තකාලයේ නොවැම්බර් මස විදුලි බිල්පත පියවීම | 258.30 |
| 52 | 2021.12.23 | 2021 දෙසැම්බර් මස කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම | 1,691,441.93 |
| 53 | 2021.12.23 | එම්.ඩී.කේ.සී.ගුණතිලක මහත්මිය, සභා ලේකම් -නොවැම්බර් මස නිවාඩු දින වැටුප් ගෙවීම | 6,690.00 |
| 54 | 2021.12.24 | 2021 දෙසැම්බර් මස මන්ත්‍රී දීමනා ගෙවීම | 294,000.00 |
| 55 | 2021.12.31 | කළමනාකරු, තවිඳු පොත්හල, මීගහකිවුල - මීගහකිවුල, කලුගහකඳුර, පිටමාරුව පුස්තකාල තුන සඳහා ජුලි මස පුවත්පත් ලබාගැනිම වෙනුවෙන් ගෙවීම් කිරිම | 12,980.00 |
| 56 | 2021.12.31 | කළමනාකරු, තවිඳු පොත්හල, මීගහකිවුල - මීගහකිවුල, කලුගහකඳුර, පිටමාරුව පුස්තකාල තුන සඳහා අගෝස්තු මස පුවත්පත් ලබාගැනිම වෙනුවෙන් ගෙවීම් කිරිම | 6,890.00 |
| 57 | 2021.12.31 | කළමනාකරු, තවිඳු පොත්හල, මීගහකිවුල - මීගහකිවුල, කලුගහකඳුර, පිටමාරුව පුස්තකාල තුන සඳහා ඔක්තෝබර් මස පුවත්පත් ලබාගැනිම වෙනුවෙන් ගෙවීම් කිරිම | 13,500.00 |
| 58 | 2021.12.31 | කළමනාකරු, තවිඳු පොත්හල, මීගහකිවුල - මීගහකිවුල, කලුගහකඳුර, පිටමාරුව පුස්තකාල තුන සඳහා නොවැම්බර් මස පුවත්පත් ලබාගැනිම වෙනුවෙන් ගෙවීම් කිරිම | 13,270.00 |
| 59 | 2021.12.31 | සී/ස ඌව පළාත් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය, බදුල්ල - ඒ 4 පැකට් 25 හා නිල් පෑන් 50 මිලදිගැනිම වෙනුවෙන් ගෙවීම් කිරීම | 23,050.00 |
| 60 | 2021.12.31 | ඩී.එම්.ආර්.යු.කේ.දිසානායක මයා, ලංකා ඉන්ධන පිරවුම් හල, මීගහකිවුල - සභාව සතු වාහන සඳහා නොවැම්බර් මස ඉන්ධණ ලබාගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 156,585.00 |
| 62 | 2021.12.31 | එස්.එම්.එල්.එච්.ජයවර්ධන මහතා, ගරු සභාපති - දෙසැම්බර් මස ගමන් වියදම් ලබාගැනිම | 20,000.00 |
| 63 | 2021.12.31 | එම්.ඩී.කේ.සී.ගුණතිලක මහත්මිය, සභා ලේකම් - 2021.11.09/21 යන දින වල ක්ෂේත්‍ර රාජකාරියන්හි නිරතවිම වෙනුවෙන් ගමන් වියදම් ලබාගැනිම | 2,000.00 |
| 64 | 2021.12.31 | එම්.ඩී.කේ.සී.ගුණතිලක මහත්මිය, සභා ලේකම් - 2021.12.01/04/05/06/07/08/20/21/22 යන දින වල ක්ෂේත්‍ර රාජකාරියන්හි නිරතවිම වෙනුවෙන් ගමන් වියදම් ලබාගැනිම | 7,000.00 |

| | | | |
|---|---|---|---|
| 65 | 2021.12.31 | සභා ලේකම්, ප්‍රාදේශිය සභාව, මීගහකිවුල - 2021.12.24 දින පැවැති මහ සභා රුස්වීමට අතින් දරණ ලද වියදම් පියවීම | 8,960.00 |
| 66 | 2021.12.31 | කළමනාකරු, අබාන්ස් ඩීලර්ස්, ජනහිත ප්‍රයිවට් ලිමිටඩ්, මීගහකිවුල - වල් කපන යන්ත්‍රයක් මිලදිගැනිම | 19,500.00 |
| 67 | 2021.12.31 | එස්.එම්.අයි.ආර්.සී.සමරකෝන් මහතා, ඉන්දික හාඩ්වෙයාර් හා ට්‍රේඩර්ස්, කැටවත්ත පාර, මීගහකිවුල - සභාව විසින් සිදු කරන ලද ශ්‍රමදාන කාර්යයන් සඳහා අවශ්‍ය වූ ද්‍රව්‍ය මිලදිගැනිම වෙනුවෙන් ගෙවීම් කිරීම | 4,870.00 |
| 68 | 2021.12.31 | ටී.වසන්ති මහත්මිය, වර්ණසූරිය ඔටෝ සර්විස්, මීගහකිවුල - 270-1735 ට්‍රැක්ටර් රථයේ ලිවර් එක හා හයිඩ්‍රොලික් සර්විස් කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 4,800.00 |
| 69 | 2021.12.31 | ටී.වසන්ති මහත්මිය, වර්ණසූරිය ඔටෝ සර්විස්, මීගහකිවුල - YTS ටොන් 8 ගල් රෝල වාර සේවා කිරිම වෙනුවෙන් ගෙවීම් කිරීම | 22,850.00 |
| 70 | 2021.12.31 | ටී.වසන්ති මහත්මිය, වර්ණසූරිය ඔටෝ සර්විස්, මීගහකිවුල - 270-1735 ට්‍රැක්ටර් රථයේ ගියර් කෙක්ස් කවර ගලවා හරවි තිබු වීල් ගලවා නැවත සවි කිරිම වෙනුවෙන් ගෙවීම් කිරීම | 4,750.00 |
| 71 | 2021.12.31 | එස්.ඩී.එන්.ප්‍රගීත් හේමන්ත මයා,කෘෂි ආයුධ නිෂ්පාදකයෝ මීගහකිවුල - කැති 03ක් මිලදිගැනිම වෙනුවෙන් ගෙවීම් කිරීම | 4,200.00 |
| 72 | 2021.12.31 | එස්.ඩී.එන්.ප්‍රගීත් හේමන්ත මයා,කෘෂි ආයුධ නිෂ්පාදකයෝ මීගහකිවුල - කැති 03ක් මුවහත් කිරිම වෙනුවෙන් ගෙවීම් කිරීම | 1,500.00 |
| 73 | 2021.12.31 | කළමනාකරු, හේෂාන් ඉංජිනියරින් වර්ක්ස්, මීගහකිවුල - RD 6200 ට්‍රැක්ටර් රථය අවුල් බ්‍රෂ් දෙක පෑස්සීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 2,450.00 |
| 74 | 2021.12.31 | කළමනාකරු, වික්‍රම ටයර් හා ඔයිල් සෙන්ටර්, මීගහකිවුල - YTS ටොන් 8 ගල් රෝල සඳහා ග්‍රීස් කිලෝ 02ක් මිලදිගැනිම වෙනුවෙන් ගෙවීම් කිරීම | 2,800.00 |
| 75 | 2021.12.31 | කළමනාකරු, වික්‍රම ටයර් හා ඔයිල් සෙන්ටර්, මීගහකිවුල - UPLL 6984 ටිපර් රථයේ 1000X 20ටියුබ්, 20 කොලර් යෙදිම හා වැඩකුලිය වෙනුවෙන් ගෙවීම් කිරීම | 10,400.00 |
| 76 | 2021.12.31 | පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ, පළාත් අධ්‍යක්ෂ (යාන්ත්‍රික) කාර්යාලය, කහගොල්ල - RD 9389 ට්‍රැක්ටර් රථයේ 2019.03006 පසු පරීක්සාව වෙනුවෙන් ගෙවීම් කිරීම | 1,700.85 |
| 77 | 2021.12.31 | ඩී.එම්.ජනාක රුවන් කුමාර මහතා, වැඩ පරිපාලක - 2021 වර්ෂය සඳහා හිමි නිල ඇඳුම් දීමනා ගෙවීම | 4,000.00 |
| 78 | 2021.12.31 | ඩී.එම්.ගුණදාස මයා, අංක 04 එළමානවත්ත,පිටමාරුව - අගොස්තු හා නොවැම්බර් මස පුංචි ලෝකාන්තයේ දෛනිකව උපයන ලද ආදායමෙන් 30% කොමිස් මුදල ගෙවීම | 4,155.00 |
| 79 | 2021.12.31 | වීරප්පන් චන්ද්‍රසේකරන් මයා, රෝබේරියවත්ත,පිටමාරුව - නොවැම්බර් මස පුංචි ලෝකාන්තයේ දෛනිකව උපයන ලද ආදායමෙන් 30% කොමිස් මුදල ගෙවීම | 3,750.00 |
| 80 | 2021.12.31 | වීරප්පන් චන්ද්‍රසේකරන් මයා, මයා, රෝබේරියවත්ත,පිටමාරුව - - නොවැම්බර් මස පුංචි ලෝකාන්තයේ දෛනිකව උපයන ලද ආදායමෙන් 30% කොමිස් මුදල ගෙවීම | 3,000.00 |
| | | **මුළු එකතුව** | **2,856,771.94** |

**2021 දෙසැම්බර් මස ආදායම්, වියදම් වාර්තා හා සභාවේ වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තාව සම්මත කිරීමට සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා සභාපති එස්.එම්.එල්.එච් ජයවර්ධන මැතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා ස්ථිර කලේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතවය මත 2021 දෙසැම්බර් මස ආදායම්, වියදම් වාර්තා හා සභාවේ වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

## <u>ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස්</u>

### <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා</u>

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා සභාව අමතමින් මම මුලින්ම මතක් කරන්න ඕන රු:75,000/= යෝජනාව සම්බන්ධයෙන්. මම මාර්තු මසේ දුන්නේ. ඒත් සභාවට ඒ යෝජනාව දැම්මේ නැහැ. ඒ යෝජනාවේ තියෙන්නේ දුම්මැටි කඳුර ප්‍රජා ශාලාවට සෙවිලි ආධාර ලබා දීමට තියෙන්නේ රු: 75,000/= ට.
ඒවගේම අලුත් අවුරුද්දක් ලැබුවා .සභාවේ සියළුම දෙනාටම සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.
ගිය සභා වාරයේදී මම සභාවේ නොමැති වේලාවක මා සම්බන්ධව මගේ මන්ත්‍රී තුමා යම් කිසි ප්‍රකාශයක් කර තිබුණා මේ සභාව නොමඟ යවන්න. කපිල මන්ත්‍රීතුමා මේ සභාවේ විපක්ෂ නායකතුමා නෙමෙයි මේ සභාවේ මන්ත්‍රීතුමියකගේ නමක්. කෙසේ නමුත් එක්සත් ජාතික පක්ෂයේ තවමත් මේ සභාවේ කණ්ඩායම් නායකයා විදිහට පිලිගන්නවා.එක්සත් ජාතික පක්ෂයෙන් මාව පිලිගන්නවා. මහ ලේකම් තුමා ඒ සම්බන්ධව කටයුතු කරපු නිසා තමයි මට යම් යම් තොරතුරු මහ ලේකම් තුමාට දෙන්න සිදු වුනේ. ඔබතුමා දන්නවා පහුගිය අයවැය අවස්ථාවේදී අපේ මන්ත්‍රීවරු දෙන්නෙක් හිටියේ නැහැ.ඒ අවස්ථාව වන විට සභාව ඉවර වෙන්න කලින් වගේ පළාත් coordinator මහත්මිය මට call එකක් දීලා ඇහුවා අද සභාවේ අයවැයට මොකද වුනේ කියලා මම කිව්වා අපි තුන් දෙනෙක් විරුද්ධ වුනා දෙන්නෙක් ඇවිල්ලා හිටියේ නැහැ කියලා. එදිනම හවස මහ ලේකම් තුමා මට දුරකථන ඇමතුමක් දීලා කපිල මොකද වුනේ ඇයි අයවැයට ඔයගොල්ලෝ විරුද්ධ වුනේ නැද්ද මම කිව්වා තුන්දෙනයි සර් හිටියේ දෙන්නෙක් සභාවට ඇවිල්ලා හිටියේ නැහැ කියලා. ඒ ආවේ නැති දෙන්නාගේ නම් මට දෙන්න පුළුවන්ද කියලා ඇහුවා. මම ඊට පස්සේ අපේ නන්දන මන්ත්‍රීතුමාත් බාල මන්ත්‍රීතුමාත් එදා හිටියේ නැහැ කියලා ප්‍රකාශ කරා.ඒ අනුව යම් කිසි විනය කටයුත්තක් සිද්ධ වුනා. නමුත් මට අවශ්‍යතාවයක් තිබුනේ නැහැ මගේ මන්ත්‍රීවරු පාවා දීලා ඒකෙන් නෙරපලා දාන්න.මොකද මම පැහැදිලිව කියනවා මේ සභාවට මේ ඉන්න හතරදෙනාම මගේ නිර්දේශය මත පත්වුණු අය. බාල මන්ත්‍රීතුමාට නොමිනේෂන් දුන්නේ මගේ වුවමනාවට.මේ පත්වුණු මන්ත්‍රීලා තුන්දෙනාම පත් වුනේ ආසන සංවිධායකතුමාගේ අත්සනින් වුනාට මමයි කිව්වේ සර්ට මට වැඩ කරන්න පුළුවන් තුන්දෙනෙක් දෙන්න කියලා. මේ තුන්දෙනාම පත් වුණේ මගේ ඉල්ලීමට ඇහුන්කන් දීලා මගේ අවශ්‍යතාවයට. බාල මන්ත්‍රීතුමා බොහොම පැහැදිලිව දන්නවා මහ ලේකම් තුමා මෙතුමාගේ විනය කටයුතු ඉවර කරලා මට කතා කරා. දහනවවෙනිදා දීලා තියෙන්නේ මෙඩිකල් ඒක. සභාව තිබුනේ විසිදෙවෙනිදා.

මූලාසනය සභාව අමතමින් මන්ත්‍රීතුමා ඕක පක්ෂේ කතාවක්. කණ්ඩායම් රැස්වීමක් තියලා කියන්න. මේක අපිට දැනගන්න අවශ්‍ය නැහැ.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා සභාව අමතමින් මේ සභාවේ පක්ෂ හතරක කට්ටිය ඉන්නවා. කිසිකෙනෙක් මේ සභාවේ කතා කරලා නැහැ විනය සම්බන්ධව කතා කරේ නැහැ. නමුත් මම කනගාටු වෙනවා මගේ මන්ත්‍රීවරුන්ට විනයක් තිබුනේ නැහැ මෙතනට ඇවිල්ලා ඒ විනය පරීක්ෂණය සම්බන්ධයෙන් මාව විවේචනය කිරිම

සම්බන්ධව. මෙතුමාගේ බේරා ගැනීමේ ලියුම ලියලා දුන්නේත් මම. බාල මන්ත්‍රීතුමා දමිල ජාතිකයෙක් හින්දා මෙයාට සිංහල තේරෙන්නේ නැති හින්දා මං එයාට කියලා දුන්නා මෙන්න මේ හේතු දාලා ලියුම

යවන්න කියලා.විනය පරීක්ෂණය වේලාවෙත් ඕන ඒකක් කරන්න තිබුණා ඒත් සර්ට මම කිව්වා අනුකම්පා කරන්න අවවාදයක් දීලා එවන්න කියලා. ඒ නිසා ද්වේෂයෙන් වෛරයෙන් කටයුතු කරා නෙමෙයි මගේ රාජකාරියක් මම කරලා තියෙනවා. මං මේ සභාවේ විපක්ෂ නායකතුමා විදිහට මහ ලේකම් තුමත් පිලිගන්නවා. මේ කිසිම මන්ත්‍රී කෙනෙක් ඇහිලා නැහැනේ තමන්ගේ විනය කටයුත්තක් සම්බන්ධයෙන් මේ සභාවේ කිව්වේ නැහැනේ.ඒවා පක්ෂයත් තෙක්ක විසඳගන්න ඕන. සඳරුවන් කියන සංවිධායක තුමාට අවශ්‍යතාවයක් තිබුනා මාව විපක්ෂ නායක කමෙන් අයින් කරන්න. එතුමාත් කොහොම හරි හදලා මෙතුමියට දුන්නා. නමුත් එතුමියගේ කටයුතු සම්බන්ධයෙන්වත් මගේ කටයුතු සම්බන්ධයෙන්වත් මහ ලේකම් තුමා විමසන්නේ නැහැ.

මූලාසනය සභාව අමතමින් මට තේරේනවා ඔබතුමන්ලාගේ පක්ෂය ප්‍රතිසංවිධානය කරගන්න කළමනාකරණය කරගන්න. ඔබතුමාටයි මෙතුමියටයි ලියුම් දෙකක් දෙන පක්ෂයක්ද.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා සභාව අමතමින් ඒක සංවිධායකතුමා දීපු එකක් මහ ලේකම් තුමා දීපු එකක් නෙමෙයි. මම කනගාටු වෙනවා.

මූලාසනය සභාව අමතමින් මන්ත්‍රීතුමියට හම්බවුනා කියපු එක අදක ඊයේක වුණ එකක් නෙමෙයි.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා සභාව අමතමින් සංවිධායකතුමා මෙතුමිටත් ලියුමක් හදලා දුන්නා.

මූලාසනය සභාව අමතමින් ඒක වැරදියිනේ.ඔගොල්ලෝන්ගේ පක්ෂෙ ලොකු දුර්වලතාවයක්. ඒක හදා ගන්න.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා සභාව අමතමින් නායකතුමා තවමත් පිලිගන්නේ මාව.

මූලාසනය සභාව අමතමින් අපිත් ඔබතුමා තමයි පිලිගත්තේ.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා සභාව අමතමින් තවමත් මේ ලියුම් වල ලිපිනය තියෙන්නේ කණ්ඩායම් නායක එක්සත් ජාතික පක්ෂය

මූලාසනය සභාව අමතමින් එ.ජ.ප යත් දැන් දෙකට බෙදිලානේ ඉන්නේ අපි හිතුවේ ඔබ සමගි ජන බලවේගේ කියලා එතුමිය එක්සත් ජාතික පක්ෂයේ කියලා.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා සභාව අමතමින් දැනට මේ පස්දෙනාම නියෝජනය කරන්නේ ඡන්දේ ඉල්ලලා අවේ එක්සත් ජාතික පක්ෂයෙන්. මට කලකිරීමක් ඇතිවීම නිසා මේ කතාව කරේ.

මූලාසනය සභාව අමතමින් ඔබතුමන්ලාගේ පක්ෂේ ගැටළුවක්. ඒක නිසා කණ්ඩායම් රැස්වීමක් තියා ගන්න.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා සභාව අමතමින් මට විනයක් තිබුණ නිසා තමයි මේ සභාවේ ඒ සම්බන්ධව කතා කරේ නැත්තේ. නමුත් මෙතුමා මේ සභාවේදී කතා කරපු නිසා තමයි මේ සභාවේදී ඒක නිරවුල් කර ගන්න ඕන වුනේ.මම ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරනවා යම් කිසි ප්‍රශ්නයක් මාත්තෙක්ක හරි පක්ෂයත් තෙක්ක තියෙනවා

නම් ඒක අපි පක්ෂයේ නායකයෝත් තෙක්ක හරි සංවිධායකත් තෙක්ක හරි ඒ ප්‍රශ්නේ කතා කරලා බේරගමු. මේ සභාව තියෙන්නේ ප්‍රදේශයේ ප්‍රශ්න විසඳන්න මිසක් පක්ෂ වල රණ්ඩු සම්බන්ධව කතා

කරන්න නෙමෙයි.ඒක අපි කවුරුත් තේරුම් ගන්න ඕන. මේ කිසි මන්ත්‍රී කෙනෙක් එහෙම කතා කරලා නැහැ. ඔබතුමාමාව විවේචනය කරේ මෙතන ඔබතුමාගේ විනය කටයුතු සම්බන්ධයෙන් පක්ෂෙ ගත්ත තීන්දුවක් අනුව. ඒක මගෙන් අහපු දේට මම ලබා දුන්න උත්තරයක්. මින් සම්බන්ධව ඉදිරියේදී ඒ අඩුපාඩු නොවේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී බාලසුන්දරම් මැතිතුමා</u>

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් මම කතා කරන්න ගියේ අපේ ජනතාවගේ ප්‍රශ්න ගැන. නමුත් අපේ කපිල මන්ත්‍රීතුමා විසින් මතක් කරපු නිසා.

මූලාසන සභාව අමතමින් ඒ සම්බන්ධව ඔබදෙපල කතා කරලා විසඳගන්න.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් එතුමා වැරදියට තේරුම් අරගෙන ඉන්නේ. එතුමා මට මහ ලේකම් තුමාගේ විනය පරීක්ෂණයේදී යන්න ලියුම හදලා දුන්නා මතකයි නමුත් එතැනට ගියාට පස්සේ මහ ලේකම්තුමා විසින් මං අහන කොට එතැනින්න මම පොහොට්ටුවේ සභාපතිතුමා ශක්තිමත් කිරීම සඳහා මම ඕනෑකමින්ම සභාවට පැමිණියේ නැහැ කියලත් මම ඒ ගොල්ලාන්ට සහය දුන්නා කියලා මතයක් තමයි එතුමා ලිඛිතව ලියලා දුන්නේ කියලා.

මූලාසන සභාව අමතමින් එතුමත් මාව ගොඩක් ශක්තිමත් කරා. එහෙමනම් මම ලියුමක් දෙනවා මෙතුමා තමයි වැඩිපුරම මාව ශක්තිමත් කරේ. මේ සැරේ ආණ්ඩුව පෙරලෙයි කියලා බයට මට විරුද්ධව ඡන්දේ දුන්නා කියලා ඕන නම් මම ලියුමක් දෙන්නම්.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් මම සංවිධායක තුමාට දැනුවත් කරලා තිබුණා ඒ දිනයට මට යන්න බැරි වුණා සභාවට ගියේ නැහැ. මම ලෙඩ වෙලා ඉන්නේ අනික අපේ ගෙදර උත්සවයක් තිබුණා. ඒක නිසා මට යන්න බැරි වුණා. ඒ සම්බන්ධවකලින් දැනුවත් කලා. එතුමා මගේන් ඇහුවා ඔබතුමා විපක්ෂ නායකතුමාට කිව්වේ නැද්ද කියලා. මම ඊට පස්සේ එතුමාගේන් ඇහුවා පක්ෂයෙන් එතුමාව විපක්ෂ නායකතුමා හැටියට තමයි පිලිගෙන තියෙන්නේ සභාවේ. නමුත් ශ්‍රියාලතා මන්ත්‍රීතුමියට ලියුමක් දීලා තියෙන්නේ එතුමිය විපක්ෂ නායකතුමිය කියලා.

මූලාසන සභාව අමතමින් මට පොඩි ආරංචියක් ලැබිලා තියෙනවා ඔබතුමා කියලා තියෙනවා වැඩියෙන්ම සභාපතිතුමත් තෙක්ක ඉන්න නිසා එතුමාව විපක්ෂනායකතුමා හැටියට පිලිගන්නේ නැහැ කියලා.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් මම අහනවා විපක්ෂනායකතුමා කවුද ඔතන. ඒක තමයි මං සංවිධායකතුමාට පැහැදිලිව කිව්වා.

රෝබ්රියේ ප්‍රධාන පාර හදා ගෙන යනවා නමුත් ජංගම බස් රථය රාගලින් මෙහාට එන්නේ නැහැ පස් ටික කපලා පාරට දාලා ඒවා අයින් කරන්නේ නැතුව හැමතැනම ටික ටික අයින් කරනවා.

මූලාසන සභාව අමතමින් මන්ත්‍රීතුමා මම ඊයේ ගියා. ඊයේ ගිහිල්ලා මම බැලුවා.ඇත්තටම ඒ වැඩේ එහෙම කරලා තිබුණා. රුහුණු කන්ට්‍රක්ෂන් සමාගමෙන් කරන්නේ එකෙත් වෙනත් පුද්ගලයෙක් තමයි ඕක කරන්නේ. මෙහේ PM officer ගෙන් පාලනය වෙන්නේ. මම මෙහේ PM ටත් දොස් කිවුවා.මම ඊයේ කතා කරා විධායක ඉංජිනේරුතුමාටත් කතා කරලා කිව්වා මේ වැඩේ බලන්න කියලා. අපි මේක නිල වශයෙන් ලියුමකුත් සභා යෝජනාවක් වශයෙන් ස්ථිර කරලා මේක අනිවාර්යෙන්ම කරන්නේ නැහැ පාර මහ කඩලා කඩලා දාලා තියෙනවා.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් පොඩි ළමයි කිලෝමීටර් 3ක් විතර පයින් එන්න වෙලා තියෙනවා. උදේ පාන්දර එන්න වෙලා තියෙනවා. ඒක නිසා එය සම්බන්ධව සොයා කටයුතු කරන ලෙස ඉල්ලනවා.

ඒවගේම මම ගොඩක් සතුටු වෙනවා මේ සැරේ අයවැයේදී ජනාධිපතිතුමා රජයේ සේවකයන්ට රු:5,000.00ක් ලබා දීලා තියෙනවා. නමුත් මේ රටේ කොරෝනා කාලයේදී වතුකර ජනතාව තමයි ආණ්ඩුව ශක්තිමත් කරේ ආර්ථිකය පැත්තේන්. මම හිතන්නේ ගිය අවුරුද්දේ තේ කර්මාන්තය සඳහා ඩොලර් මිලියන 1,200ක් ලංකාව ආදායම් ලබා තියෙනවා. නමුත් වතුකර ජනතාවට සහනය කියලා පිටි කිලෝ 1ක් රු:80.00 ට දෙන්නම් කිවුවා නමුත් පිටි කිලෝ 15ක් ගන්න රු:1,200.00 යි. රටට ආදායම ලබලා දෙන වතුකර ජනතාවට රු:1,200.00 යි සහනාධාර ලැබිලා තියෙන්නේ.ඒකත් වතුකර සමාගමේ ස්ථිර සේවකයන්ට පමණයි අනිත් කට්ටියට නැහැ කියලා. නමුත් අවුරුදු 6 ක් විතර සේවයේ හිටපු අය ඉන්නවා ස්ථිර කරන්නේ නැතුව. මං හිතන්නේ ඒක ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. ආණ්ඩුවටයි මේ රජයට ආදායම් ලබලා දෙන මේ අඩු ආදායම් ලාභීන් වන වතුකර ජනතාව ඔය රු:5,000.00 දීමනාව ලබා දීලා තිබුණානම් ඇත්තටම මම අද ගොඩක් සතුටු වෙනවා ඒ සම්බන්ධව. බඩු මිල වැඩි කරලා ඒගොල්ලෝ තවත් අසරණ තත්වයකට පත් කරලා.

ඒවගේම රෝබේරියේ ඔබතුමා කිවුව ඉස්කෝලේ ළඟට වීදි ලාම්පුවක් ලබලා දෙන්නම් කියලා. තවමත් වීදි ලාම්පු නැහැ.

මූලාසන සභාව අමතමින් මේ මාසේ ඒ වීදි ලාම්පු ටික දෙනවා.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් ඒවගේම මේ අවුරුද්දට වෙන් කරපු මුදල ඒ යෝජනා වලට ආපු සියළුම මුදල් වලට වැඩ කටයුතු කරගෙන නැවත සංශෝධනයක් කරන්නේ නැහැ කියලා. ඒ නිසා මං අහන්නේ අපිට ආණ්ඩු පක්ෂය විපක්ෂය කියලා කියන්නේ නැතුව රු:100,000.00 අතිරේක මුදලක් ලබා දීලා තිබ්බා. නමුත් ඒ යෝජනාව සියළුම මන්ත්‍රීවරුන් හට මේ අවුරුද්දේ හම්බ වෙනවාද

මූලාසන සභාව අමතමින් ඒක මන්ත්‍රී යෝජනානේ. ඒක අපි දැනට යන්නේ අයවැය යෝජනාවෙන්. අයවැයට ලක්ෂ 30ක් ගත්තානේ කොට්ඨාශයකට ඒක තමයි යන්නේ. තවම ලක්ෂ 40 යෝජනාව ක්‍රියාත්මක වුනේ නැහැ.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් මගේ ඉල්ලීමක් තිබුණා එලමාන තියෙනවා පොඩි පාලමක්.ලක්ෂ 10 ක් විතර යනවා.

මූලාසන සභාව අමතමින් පාලම් යෝජනාවට දාන්න.ඔබතුමාගේ යෝජනා ටික දෙන්න දර්ශන මහත්තයාට.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා</u>

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා සභාව අමතමින් ලැබුවා වූ අලුත් අවුරුද්ද ගරු සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීවරුන්ටත් මන්ත්‍රීතුමියන්ලාටත් සභාවේ සියළු සේවකයන්ටත් මේ අවුරුද්ද වාසනාවන්ත වැඩක් කරන්න පුළුවන් අවුරුද්දක් වෙන්න කියලා මුලින්ම ප්‍රාර්ථනා කරනවා. ඉස්සෙල්ලාත් අපි මේ කතාව කියන්න වෙනවා මං හිතනවා සියළු මන්ත්‍රීවරු අවධානය යොමු කරයි කියලා. මොකද අපි මොනා වුනත් ඉන්න අවසාන අවුරුද්ද මේක. ඒ නිසා මොනාහරි දෙයක් අධිභාරයක් වෙන්න කලින් මේවා සභාවට අඩුපාඩු පෙන්නා දෙන්නට සුදුසුයි කියලා මං හිතනවා. ඒවගේම මං මේ සභාවක් ගෙන එනවා ගරු බාල මන්ත්‍රීතුමා වෙනුවෙන් දැනට ගෙවන භාෂා පරිවර්තන දීමනාව නොගෙවිය යුතුයි කියලා. ඒවගේ යෝජනාවක් ගේනවා ඒකට හේතු කාරණා තියෙනවා. මං හිතනවා දැනුත් ගිය මස සභා වාර්තාවත් ඔබතුමා ගාව

තියෙන්නේ දෙමළ පරිවර්තනයද කියලා මම දන්නේ නැහැ. එහෙම තියෙනවා නම් මේ සභාවට පෙන්නන් කියන එකත් මේ වේලාවේදී ප්‍රකාශ කර සිටිනවා. මං දන්න විදිහට දැනට තියෙන්නේ සිංහල

පරිවර්තනයක්. එතකොට අපි මේ මුදල ගෙවන්නේ පරිවරිතන වෙන විදිහට තමයි බාල මන්ත්‍රීතුමාට ගෙවන්නේ. එතකොට එතුමා ඇවිල්ලා මේ අපිත් පාවිච්චි කරන මේ සිංහල සභා වාර්තාව තියා ගෙන ඉන්නවා නම් එහෙම මුදලක් ගෙවන එකේ තේරුමක් නැහැ. මේ වියදම අපරාධයක් විදිහටත් එහෙම නැත්තම් මේක සභාව නොමඟ යවලා යම් කිසි මුදලක් ගන්නවා කියන එකයි පැහැදිලි වෙන්නේ. අනිත් එක තමයි මෙහෙම පරිවර්තනයක් තියෙනවා නම් අඩුම තරමේ මේ සභා වාර්තාවේ දෙමළ පිටපතක් මේ සභාවේ තියෙන්න ඕන. එහෙම තියෙනවාද කියලා බලන්න කියන ඒක සභාපතිතුමාට මම ප්‍රකාශ කරනවා.එවගේම තමයි දැනට ඒ පරිවර්තන කටයුතු සිද්ධ කරන්නේ ධනලක්ෂ්මී කියලා එක් කෙනෙක් තමයි ඒ පරිවර්තන කටයුතු සිදු කරන්නේ. එතකොට එතුමිය කවුරු වුනත් කමක් නැහැ මම දන්න හැටියට බාල මන්ත්‍රීතුමාගේ අක්කාගේ දියණිය තමයි ඒ කටයුතු සිද්ධ කරන්නේ.හැබැයි පැහැදිලිවම කියන්න පුළුවන් මේ භාෂා පරිවර්තනයක් සිද්ධ වෙන්නේ නැහැ කියලා. අනිත් එක තමයි අඩුම තරමේ මාසයකට සැරයක්වත් සභාව තියෙන්නේ එක දවසයි එදාටවත් මේ සභාවට පැමිණිය යුතුයි අපි අවසරයක් දුන්නා නිවසේදී ඒ කටයුතු කරන්න කියලා. අනිත් කාරණාව තමයි මේ මුදල් ලබා ගන්නේ කවුද එතකොට සභාවෙන් ගෙවනවානම් ඒ පරිවර්තන දීමනාවන් ඒ ආදාල කෙනා මෙතෙනට ඇවිල්ලා මුදල් ලබා ගත යුතුයි. ඒක තමයි නීතිමය ක්‍රමේ හැබැයි ඒ දෙය සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා මේවා පරිවර්තන දීමනා අපේ මුදල් අයවැය ලේඛණයේදී අනුමත කරනවා ඒවා මේ සභාවටත් හරි නැහැ අපිටත් හරි නැහැ. කවදා හරි දවසක ප්‍රශ්නයක් වුනොත් අපිත් මේ සභාවේ ඉදගෙන මේවා අනුමත කරා වගේ කරලා තියෙනවා ඒ නිසා මේ සම්බන්ධව තවත් මං හිතනවා අපිට මේ අනුමත කරන්න බැහැ මේවාගේ වියදම් නම්. මේ සභාවේ බුද්ධිමත් මන්ත්‍රීවරුන්ට කියනවා මේ සම්බන්ධව ඔබතුමාලාගේ අදහස් මොනවා හරි තියෙනවා නම් ඉදිරිපත් කරන්න මොකද මේකේ අපි අනුමැතිය දීලා තියෙන්නේ ඒක හරි විදිහට කරන්න ඒක කෙරෙන්නේ නැතැතම් ඒක තේරුමක් නැහැ ඒ වියදම දීලා ඒක නිසා මම යෝජනාවක් කරේ නැවත දෙන්න එපා කියලා කියන්නේ කරුණු කාරණා ඇතිව ඉදිරිපත් කරේ. ඒ නිසා ඉදිරියේදී භාෂා පරිවර්තනය සිද්ධ කරපු ලියවිලි නැත්තම් ඉදිරියේදී මේ සම්බන්ධව මොනවහරි කටයුතු සිද්ධ කරන්නට සුදානම් කියන ඒ පණිවිඩයත් ලබා දෙමින් මේ වර්ෂයේදී ඉදිරි කාලය තුල වැඩ කොටසක් කරන්නට පක්ෂයක් විදිහටත් පුද්ගලයෙක් විදිහටත් සභාපතිතුමාටත් සහයෝගය දෙනවා කියන ප්‍රකාශය කියමින් නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී බාලසුන්දරම් මැතිතුමා**</u>

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් මට විනාඩියක් දෙන්න මෙතුමාගේ භාෂා පරිවර්තන සම්බන්ධව උත්තරයක් දෙන්න. භාෂා පරිවර්තනයක් කරලා දෙන්න කියලා ඉල්ලුවේ ඉස්සෙල්ලාම මට සිංහල භාෂාව කතා කරන්න පුළුවන් වුනාට සිංහල කියවන්න බැහැ හරියට. ඒ කියන්නේ සභා වාර්තාවේ තියෙන්නේ යම් කිසි තැන් වැරදි විදිහට තේරුම් අරගෙන ඇවිල්ලා කතා කරා නම් සභාවට හොඳ නැහැ. ඒ කියන්නේ ඒ මුදලට පළාත් පාලනෙය් හිටපු කෙනා භාෂා පරිවර්තනය සඳහා එතුමා ඒ මුදලට බැහැ කියපු නිසා තමයි අපේ ධනලක්ෂ්මී කියලා එක්කෙනෙක් ඉන්නවා එයට කියලා භාෂා පරිවර්තනය සිදු කරන්නම් කියලා මොකද හේතුව රු:5,000.00ක් වැනි අඩු මුදලකට කරන්න අපේ කෙනෙක් නිසා තමයි පුළුවන් වෙන්නේ. අනිත් ඒක එයා සභා වාර්තාව ආවම එයා ඉස්සරහම සිංහලෙන් කියවලා දෙමළෙන් පරිවර්තනය කරලා භාෂාවෙන්ම කියනවා මේ මේ දේවල් තමයි තියෙන්නේ කියලා. එතකොට වැදගත් දේවල් ටික මම දෙමළෙන් ලියා ගන්නවා. කතා කරන්න අවශ්‍ය දේවල් මගේ ගැටළුකාරි තැන් වගේ විස්තර ටික ලියා ගන්නවා. අනිත් ඒක මට සභා වාර්තාව මේ මාසේ ඒක ගහන්න බැරිවෙන්න හේතුව එතුමියගේ wedding එක තිබුණා ඒක නිසා එතුමියගේ භාෂා පරිවර්තනය වෙනුවෙන් මේ සැරේ ලබා දුන්නේ නැහැ. මම අවශ්‍ය දේ කතා කරන්න කෙටියෙන් හදලා දීලා තිබ්බේ. මට මගේ අක්කාගේ දුව දාගන්න කිසිම වුවමනාවක් නැහැ. මේ සිංහලෙන් තියෙන භාෂා පරිවර්තනයට දෙමළ භාෂාවට පරිවර්තනය කරලා ලබා දෙන්න කියලා හේතුවක් තියෙනවා සභාවේ දෙමළෙන් කතා කරන්න මට අයිතියක් තියනවා පාර්ලිමේන්තුවේ වුනාත් සිංහල දන්නවා වුනත් දෙමළෙන් කතා කරන්නේ මෙතනදී

වුනත් මම දෙමළෙන් කතා කරන ටික සිංහලයට පරිවර්තනය කර ගන්න එක් කෙනෙක් හදා ගන්න.මට සිංහලේ කතා කරන්න පුළුවන් නිසා තමයි මම සිංහලෙන් කතා කරන්නේ.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා සභාව අමතමින් මම කිව්වේ භාෂා පරිවර්තනය දෙන්න ඕන නැහැ කියලා නෙමෙයි මම කියන්නේ ඒ මුදල් ගන්න ධනලක්ෂ්මී එනවාද සභාවට.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් සමහර වේලාවට එනවා. සමහර වේලාවට මම ගිහින් දෙනවා.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා සභාව අමතමින් එතකොට ඒවාට කවුද අත්සන් කරන්නේ. ගැටළු තියෙනවා මන්ත්‍රීතුමා.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් දවස් දෙකක් විතර එතුමියට එන්න බැරි වෙලා ලිඛිතව දීලා තිබ්බා එයාගේ භාෂා පරිවර්තන දීමනාව මගේ අතට ලබා දෙන්න කියලා.

මූලාසන සභාව අමතමින් ධනලක්ෂ්මිට ඇවිල්ලා මුදල් ගන්න කියන්න. අපේ office එකත් දැන ගන්න ඕන ආදාල පුද්ගලයට ආදාල මුදල් ලබා දෙන්න.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා සභාව අමතමින් ධනලක්ෂ්මී කියන කෙනා සභාවට එන්නේ නැහැ ආදාල මුදල ගන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා</u>

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා සභාව අමතමින් ලැබුවා වු 2022 සුභ නව වසරක් වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. ප්‍රථමයෙන්ම ස්තූතිවන්න වෙනවා අපේ ගරු උප සභාපතිතුමාට අපේ හිතට නොවැටුණු දෙයක් එතුමා මේ සභාවේ ගරුත්වය ගැන හිතලා ප්‍රකාශ කිරිම සම්බන්ධයෙන් ඒ මුදල් හුවමාරු වීමේ තියෙන ගැටළු ඉදිරිපත් කරලා ඒක නිවැරදි කරන්නට මහන්සි වුන මන්ත්‍රීතුමාට මේ සභාව දැනුවත් සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙනවා. ඒවගේම 2022 උදා වෙද්දී අපි දේශපාලනය කරලා මේ සභාව හරහා ඔබතුමන්ලාගේ නායකත්වයෙන් මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කැටවත්ත මොරහෙල කියන ග්‍රාම සේවා වසම් දෙකේ ඔබතුමාගේ නායකත්වයෙන් මේ වසර 4ක දේශපාලන කාලය තුල විශාල සංවර්ධන ප්‍රමාණයක් කැටවත්ත මොරහෙල වසම් දෙකට ඔබතුමාගේ නායකත්වයෙන් මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ මා ඇතුළු සියළු මන්ත්‍රීවරුන්ට කැටවත්ත ගම්මානයට මෙවැනි සංවර්ධන යෝජනා ගෙන එන්න ලැබුණා. අවුරුදු ගණනාවක් තිස්සේ කතා කරපු පුවක්ගහවත්ත, මොරහෙල ගම්මැද මාර්ගය, කොස්කොටේ මාර්ගය, අරාව ගෙදර මාර්ගය, සූරියගොල්ල මාර්ගය, ඌරු පිටිය මාර්ගය, බෝගහපතන මාර්ගය, මොරහෙල විද්‍යාලයේ පඩි පෙල, ගල්කඩුවේ මාර්ගය ගණනාවක් සංවර්ධනය කරනවා. ඉතින් මේ වසර 4ක දේශපාලන කාලය තුල ඔබතුමා දැක්වු නායකත්වය නිසා මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ලලිත් ජයවර්ධන කියන නායකයා මගේ කොට්ඨාශයේ මෙවැනි සංවර්ධන යෝජනා ක්‍රියාවලි මේ වසර 4 තුල ක්‍රියාත්මක වෙද්දී මේ කොට්ඨාශයේ ග්‍රාම සේවා වසම් 20 තුල මෙවැනිම යෝජනා ක්‍රියාත්මක කරා. ඉතින් ගරු සභාපතිතුමනි සතුටු වෙනවා ඔබතුමාගේ නායකත්වය අපිට දීලා මේ වසර 4ක දේශපාලන ජීවිතයේදී. ඒවගේම තමයි කොරෝනා වසංගතයේදී මගේ කොට්ඨාශය ගැන මම කතා කරන්නේ නිරෝධායන වන හැම පවුලකටම ඔබතුමාගේ උපදෙස් පරිදි බඩු මල්ලක් ලබා දෙන්න පුළුවන් වුනා. ඒවගේම ඔබතුමාගේ මඟපෙන්වීම හා නායකත්වය තුලින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ රජයේ දැක්ම අනුව ගමට ගෙයක් රටට හෙටක් යන වැඩපිළිවෙල යටතේ නිවාස 4ක වැඩ අවසන් කරගෙන යනවා ඒකත් ඔබතුමා දුන් නායකත්වය නිසා මගේ කොට්ඨාශයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නායකත්වය අරගෙන අපිට කරන්න පුළුවන් වුනා. ඒ ගැන සතුටු වෙනවා. ඉතින් තවත් කාරණාවක් ඔබතුමාගේ උරහිසට බර දෙන්න මම මේ 2022 දී අපේ අවසාන වර්ෂය මම එය කිලෝමීටර් ලක්ෂයේ ව්‍යාපෘතියේදී යෝජනා කරා වගේම ඔබතුමාට මේ සභාවේදී මම කතා කරපු සියළුම මාර්ග මට ඉටු කර

ගන්නට ඔබතුමාගේ නායකත්වයෙන් වසර 4 තුල මේ ගෞරවනීය සභාවේ සියළු මන්ත්‍රීවරුන්ගේ සහයෝගයෙන් මට කර ගන්න පුළුවන් වුනා. ඒ හින්දා මේ 2022 දී මම යෝජනා කරනවා

කැදැත්තමංකඩ 4 කණුව මාර්ගය කිලෝමීටර් ලක්ෂයේ ව්‍යාපෘතියේදී අපි යෝජනා කරලා තිබුණා. හැබැයි මැණුම් කටයුතු කෙරුනේ නැහැ. ඉතින් ඒ දක්වා ඉදිකරන්න කියන යෝජනාව කරනවා.

මූලාසන සභාව අමතමින් කීලෝමීටර් කීයක් තියෙනවාද

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා සභාව අමතමින් කිලෝමීටර් 2.5ක් තියෙනවා.

ඒවගේම තමයි එදා ඉදන් කතා කරපු ගම්මැද්ද මාර්ගය ඉවර කරා. අපි අදහස් කරේ කහටරුප්පත් මිගහකිවුලත් යා කරන්න අපි බාලපොරොත්තු වුනේ. ඉතින් ඒක මැදකදි ඉවරවෙලා ඒ කියන්නේ කහටරුප්ප පැත්තෙන් අපේ පැත්තෙන් එන මාර්ගය අවසන් වෙලා නැහැ. ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න ඒ පිලිබඳව. ඒ මාර්ගය අපේ මාර්ගයට සම්බන්ධ වුනොත් අපි බාලාපොරොත්තු වුන දේ මීගහකිවුල නගරයට ගෙන්න පුළුවන් වෙයි සංවර්ධනය අපිට ගෙන්න පුළුවන් වෙනවා. ඒ පිලිබඳව සොයා බලන්න කියලා ගෞරවනීය ඉල්ලීමක් කරනවා.

ඒවගේම වීදී ලාම්පු හැමදාම කතා කරනවා වගේම 2022දීත් ඒ වීදී ලාම්පු ඉල්ලීම ,ඒ වගේම මෙගා ලයිට් 2 අපිට ලබා දෙන ලෙසත් ගෞරවනීය ඉල්ලීම කරනවා. ඉතාමත් සතුටුයි ලලිත් ජයවර්ධනගේ ගරු සභාපතිතුමාගේ නායකත්වය යටතේ මීගහකිවුල ප්‍රාදේශීය සභාවේදී වසර 4ක කෙටි කාලයකදී මෙතෙක් නොවිසඳුනු ප්‍රශ්න ටිකක් මොකද හීනක් විදිහට පුවක්ගහවත්ත අවසානය වන තෙක් මාර්ගයක් ඒවගේම කොස්කොටේත් ගමේ අවසනය වෙනකම් මාර්ගයක් ඌරු පිටිය ගමේ අවසානය වෙනකම් මාර්ගයක් ඉතින් මේ සිහින සැබෑ කරන්න පුළුවන් වුණු ඔබතුමාට ඔබතුමාගේ නායකත්වයට මේ 2022 දී සුභ පතලා ඉදිරි කටයුතුත් වැඩ කරගෙන යන්නට සභාවේ සියළු මන්ත්‍රීවරුන්ගේ අඩුපාඩු කම් කොට්ඨාශයේ මිනිස්සුන්ට අවශ්‍ය වන දේ ඉදි කරන්නට මේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුනේ නායකත්වයට පෙර දැරිව ඉදිරි සංවර්ධනය කරා 2022 දී මීගහකිවුලේ අපි දැකපු හීනේ අපිට වැඩිය ඔබ දැකපු හීනේ ඔබ දැකපු සුන්දර මීගහකිවුල කියන ඒ සුන්දරත්වය ගොඩන්නට මේ 2022 වර්ෂයේදී අපි මේකෙන් යන්න ඉස්සෙල්ලා ඒ හීනේ හැබෑ කරන්න ඔබතුමාටත් අපේ ගෞරවනීය මන්ත්‍රී මණ්ඩලයටත් වාසනාවන්ත වේවා කියලාත් ඒවගේම මීගහකිවුල ප්‍රාදේශීය සභාවේත් ලේකම් තුමිය ඇතුළු සියළු කාර්ය මණ්ඩලය නිලධාරින්ට මම විශේෂ ස්තූතිය පුද කරනවා. මොකද 2022 දී සුන්දර මීගහකිවුලක් තනන්නට ඇත්තටම කම්කරුවෝ සියළුම සේවක මණ්ඩලය සුන්දරත්වය රකින්න වෙහෙසෙනවා. ඒ සියළු දෙනාටත් ස්තූතිවන්ත වෙමින් සියළු දෙනාට සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. සියළු දෙනාටම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා</u>

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා සභාව අමතමින් ගෙවීගිය 2021 වර්ෂය අපිට බෝහෝ අභියෝග මධ්‍යයේ විශාල වැඩ කොටසක් කර ගැනිමට හැකියාවක් ලැබුණා ප්‍රාදේශීය සභාවක් විදිහට මැදිහත් වෙලා. මධ්‍යම ආණ්ඩුවක් විදිහට මැදිහත් වෙලා අපේ පෞද්ගලික සම්බන්ධතා හරහා මීගහකිවුල කොට්ඨාශයේ විශාල වැඩ කොටසක් ඉෂ්ඨ සිද්ධ කර ගන්න හැකියාව ලැබුණා විශේෂයෙන්ම තේනුක ඇමතිතුමාගේ විමධ්‍යගත මුදල් ලක්ෂ 17ක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇතුලේ විසුරුවා හැරියා.ඒවගේම ප්‍රාදේශීය සභාව මැදිහත් වෙලා දැඩි කැපවීමක් කරා සභාපතිතුමා ඇතුළු ඒ නිලධාරි මණ්ඩලයත් මාර්ග ලක්ෂ 20 මාර්ග ටික අපි කොන්ක්‍රීට් කරලා අවසන් කර ගත්තා. ඒ වගේම පහුගිය කොරෝනා කාලයේ සභාවෙන් හැකි ආකාරයට අපිට කරන්න පුළුවන් ආකාරයට අපි ඒ අවශ්‍ය කටයුතු මීගහකිවුල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු හා ජනතාවගේ සුභ සිද්ධිය සඳහා සිදු කරලා තියෙනවා. ඒවගේම විශාල මාර්ග පද්ධතියක් කාපට් කරමින් පවතිනවා.වැඩේ කරන කොටත් ප්‍රශ්න වැඩේ නොකරන ඉද්දීත් ප්‍රශ්න. දැන් රෝබේරිය පාරත් එහෙමයි අවුරුදු 75ක් සංවර්ධනය කර ගන්න බැරුව කිසිම දෙයක් කර

ගන්න බැරිවෙච්ච පාරක්. බාල මන්ත්‍රීතුමා හිටියේ නැති වුනත් එතුමලාගේ ආණ්ඩුවත් අවුරුදු 5ක් තිබ්බා. එතුමලාගේ යූනියන් වල නායකයෝත් දමිළ නායකයෝත් ඇමතිවරුත් හිටියා. හැබැයි එතුමලාට කර ගන්න බැරි වෙච්ච වැඩක් අපි සභාපතිතුමා මැදිහත් වෙලා තේනුක ඇමතිතුමා මැදිහත්

කර ගෙන වැඩේ කරා. එක දවසයි ගෙනිච්චේ තේනුක ඇමතිතුමා ගෙදර යන්නම ගියා රැස්වීම් වලටවත් යන්නේ නැතුව පාරේ ගිහිල්ලා කොන්ද රිදෙනවා කියලා. එහෙම ගිහිල්ලා දැන් වැඩේ වෙනවා. හැබැයි වැඩේ යන එක එතුමලාට අගය කරන්න බැහැ. කියෙනවා ප්‍රශ්නයක් මමත් ගියා ඉස්කෝලේ ළමයිට යන්න බැරිවුනා ඔබතුමාත් ගිහිල්ලා තිබුණා ප්‍රශ්නයක් තියෙනවා. CTB එකටත් කතා කරා. ඒ කොන්ත්‍රාත් සමාගම රුහුණු ඒක හැමතැනම එහෙමයි. වැඩ කරන කොට එහෙමයි. හැබැයි කරන දේ අගය කරන්නේ නැහැ.කරන දේ පිළිබඳ වටිනාකමක් නැහැ. ඒ හින්දා අඩුපාඩුම තමයි හැමදාම දකින්නේ. ඒ හින්දා විශාල මාර්ග පද්ධතිය පුංචි ලෝකාන්තයේ ඒ වගේ ඒ පැත්තට තියෙන මාර්ග පද්ධතිය දියුණු වෙන කොට සමස්තයක් විදිහට මේ මීගහකිවුල ප්‍රදේශයේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම තමයි සංවර්ධනය වෙන්නේ. අතුරු මාර්ග ටික හැදෙන කොට ගමේ ආර්ථිකය ගොඩ නැගෙනවා. එම විශාල වැඩ කොටසක් සිද්ධ වෙනවා. ඒ හින්දා අපිට තව දැනේන්නේ නැති වුනාට සමෘද්ධි ව්‍යාපාරයක් හරහා ගමේ ආර්ථිකය නගා සිටුවන්න අවශ්‍ය ද්‍රව්‍ය බෙදලා දෙනවා. හැබැයි TV ඒක බැලුවෝත් දකින්නේ හැමදාම බනින ඒවා විතරයි. පහුගිය අවුරුදු 5ක්‍රෝටන් කොළ කන්න කියපු මිනිස්සු දැන් අඬනවා. මම දන්නවා පහුගිය අවුරුදු 5 හිටපු කෘෂිකර්ම අධ්‍යක්ෂකවරු ක්‍රොටන් කොල කන්න කොස් කොල කන්න එහෙම තමයි කිව්වේ. මොන ප්‍රශ්න තිබ්බත් රටේ ප්‍රශ්නයක් තියෙනවා රට වහලා තිබ්බා කොරෝනා තිබ්බා මිනිස්සුන්ට එලියට බහින්න බැහැ රටේ ආර්ථිකයට ආදායමක් තිබ්බේ නැහැ රටට වියදම තිබ්බාට රටට ආදායම තිබ්බේ නැහැ. ඩොලර් ප්‍රශ්නයක් තිබ්බා අපේ මිනිස්සු දැන් කතා කරන්නේ ඒ සියල්ල රටේ ව්‍යසනයක් තිබ්බේ නැති විදිහට රට වහලා තිබ්බේ නැති විදිහට තමයි කතා කරන්නේ එන්නත ගහන්න එන්නත් ගේනකොට මට මතකයි සජිත්ලා අනුර කුමාරලා එන්නත් හිහ කනවා මෙහෙමයි කියලා. හැබැයි එන්නත ගහලා ඉවර වෙනකොට හොරෙන් ගිහිල්ලා ගහගන්නවා.එහෙම නායකයෝ ටිකක්. ඒ නිසා අපි ගමේ දේශපාලඥයෝ උනාට මේ නායකයෝ ටික හරියට එකතු වෙලා රටේ මේ ප්‍රශ්නයක් තියෙන වේලාවේ මේ රට ගොඩගන්න ඕන කියන එකඟතාවයකට ආවා නම් මේ ලංකාව හදන්න පුළුවන්.අපි එක පක්ෂයක් බලයට එන කොට එක පක්ෂයක් අමතක කරලා යනවා. එහෙම යුගයක් තියෙනවා. දැන් පාස්කු පහාරය අපි ගැහුවා වගේ තමයි කතා කරන්නේ. මෛත්‍රීපාල සිරිසේන එලියට බැහැලා ආණ්ඩුවක් කරේ නැති විදිහට තමයි කතා කරන්නේ. ඒ ඉන්න කාලේ රටට ගහපු ගැහිල්ල අපේ පන්සල් ටිකට ගහපු ගැහිල්ල බුද්ධාගමට ගහපු ගැහිල්ල අපි අත් දැකලා තියෙනවා. ජාතික ගීය නාමෝ නමෝ තායේ කරා ඒ වගේ රටේ තිබ්බ ඒ පන්සල් වල .තිබ්බ අලි ඇත්තු ටික ගෙනියලා වැහුවා. ඒවා අමතක කරලා මේ දැන් ඉපදුනු මෛත්‍රීපාල කෙනෙක් විදිහට තමයි මෛත්‍රීපාල සිරිසේන හැසිරෙන්නේ. අපිට මේ රට හදන්න බිම් මට්ටමේ අපි ගොඩක් වේලාවට අපේ ප්‍රාදේශීය සභාවේ ආදර්ශය දෙනවා අපි එකතු වෙලා යම් ගමනක් යනවා. මේ අවුරුද්දේත් අපි ඒ ගමන යමුයි කියන ඉල්ලීම කරනවා. ඒවගේම අපි ප්‍රාදේශීය සභාව අපි ඔබතුමත් තෙක්ක හිටගෙන ඉන්නවා මේ අවුරුද්දත් මේ ගමන යන්න ඉස්සරත් හිටියා ඉස්සරහටත් ඉන්නවා. හදා ගතයුතු ගොඩක් තැන් තියෙනවා. අපි මේ සභාවට එනකොට අපිට ඇස් දෙකට පේනවා හැබැයි අද නැහැ සේවකයෝ කීදෙනෙක් නිකම් ඉන්නවාද කියලා. වැඩ පරිපාලකලා කීදෙනෙක් ඉන්නවාද. ඔබතුමා හැමතිස්සේම මෙතන නැහැ. හැබැයි අර කාමරයේ බැලුවොත් 6ක් 7ක් නිකම් ඉදගෙන ඉන්නවා. එහා පැත්තේ කාමරයට ගියෝත් 4ක් 5ක් නිකම් ඉන්නවා. වැඩ කරන මනුස්සයා හැමදාම කැලේ කපනවා නැත්තම් කාණුව අදිනවා වතුර එක පෙරනවා. හැබැයි නිකම් ඉන්න කණ්ඩායමක් මේකේ ඇතුලේ ඉන්නවා. ඒ හින්දා මට අත්දැකීමක් තියෙනවා. එකාලේ මාසෙකට සේවකයයෝ රොටේෂන් එකක් හදලා බිත්තියේ එල්ලා තියෙනවා.මෙන්න මේ දවස් වලට මේ සේවකයෝ ඉන්නේ වෙනස් වෙන වේලාවල් තියෙනවා. කැලේ කපන්න තියෙනවා කැලේ කපන්න යන්න කියපුවාම එකම මනුස්සයාම යන්නේ. අපි ඇස් දෙකෙන් දැකලා තියෙනවා. යන්නේ නැති මනුස්සයා ජීවිතේට යන්නේ නැහැ. සමහර සේවකයෝ දකින්නේ පඩි ගන්න එන කොට පොත අත්සන් කරන්නේ එන්නේ කීයටද යන්නේ කීයටද කියලා අපි දන්නේ නැහැ. පඩි ගන්න එන දවසට සමහර විට අපි දකිනවා ඇවිල්ලා පඩි අරගෙන යනවා. එක නිසා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා කළමනාකරණය හරියට කරලා මේ

අවුරුද්දේ අපි හරියට කරොත්  ඔය කියන පාරවල් ටිකේ කැලේ කපලා ඉවර කරන්න පුළුවන්. ඔය මන්ත්‍රීවරු කියන පොඩි පොඩි වැඩ ඒ ටික සියල්ල අපිට ඉවර කරන්න පුළුවන්. බට වගයක් දාන්න මම කට්ටියක් එක්ක ගෙන ගියා මටත් එතන ඉන්න බැරි වුනා කුකුළෝ පිරුවා වාගේ කාණුව කපලා තිබුනා දවසකට. ඊට පස්සේ කට්ටියක් දම්මලා බට ටික යට කරලා දැම්මා. ඔබතුමා කිව්වා වාහන ටික හදනවා

කියලා ඒ ටික හදලා නිසි නඩත්තුවක් කරලා ආදායම් හෙවීමේ ක්‍රමවේද අපිට තියෙනවා. ඒවගේම තමයි පරිපාලනයේ යම් යම් අඩුපාඩු තියෙනවා. අපි අහන දවසේ ඉදලා මතක් කරනවා. හැබැයි ඒක නිවැරදි වෙන්නේ නැහැ.දැන් අපිට එවුවා වාර්තා සමඟ න්‍යාය පත්‍රය වැරදීලා එවුවේ කිව්වා මුදල් කමිටු වාර්තාවත් එහෙමයි. ඕක ඔහොම්මම තමයි ෆයිල් වලටත් යන්නේ.මේ අන්තිම අවුරුද්ද නෙමෙයි අපි ඉස්සරහාටත් ඉදියි මේ නිල කාලයේ අන්තිම අවුරුද්ද නිසා අපි සියළු දෙනාම එකතු වෙලා මේ අඩුපාඩු ටික හදා ගෙන අපි දැන් කාර්ය මණ්ඩලය ටිකක් ඇවිල්ලා ඉන්නවා. රාජකාරි පවරලා දීලා අපි මේ හරි විදිහට අපි මේ ගමන ගියෝත් මං හිතන්නේ අපිට මේ අවුරුද්ද වඩාත් සුභදායකයි. මේ අවුරුද්ද යම් පිබිදීමක් ලැබෙයි. මොකද මේ වෙන කොට සංචාරක ව්‍යාපාරය පණ ගහගෙන එනවා. දැන් එක කඩා වට්ටවන්න උද්ඝෝෂණයක් කරනවා මං දැක්කා උදේ ප්‍රවෘත්ති වල සංචාරක හෝටල්වල සේවකයෝ ටික පාරට බස්සලා ජනතා විමුක්ති පෙරමුණ මැදිහත් වෙලා ලංකාවේ තියෙන ගැටළු විසඳෙන්න ගොඩ එන්න පුළුවන් ක්ෂේත්‍රයක් දකින කොට ඒ ක්ෂේත්‍රයට ගහනවා. එක තමයි ඒ කට්ටියගේ සිස්ටම් එක. ඕක හරියටම කිව්වාආම් ඒකේ එක්කෙනෙක් . කොහොමද ඒ දේශපාලනය වෙන්නේ කියලා. ඒ හින්දා අපි  මේ තියෙන සියළු ගැටළුත් තෙක්ක අපි විශාල මුදල් ප්‍රමාණයක් ඇවිල්ලා තියෙනවා අපි දැන් යනවා ඒ යෝජනා ටික හදන්න. ඒ වසම් ටික ගොඩනගා ගන්න පුළුවන් වෙයි මේ මුදල් පරිමාවත් තෙක්ක. අපි යෝජනා 7ක් එකසැරේ ක්‍රියාත්මක කරනවා වසම් වල ඒ හින්දා අපිට හැකියාව ලැබෙයි ඒක ගොඩනගා ගන්න. ඒ හින්දා නව වර්ෂයේ නව දැක්මකින් අපි දැන් සුන්දර මීගහකිවුල කියන එක තවත් වෙනස් කරලා අපි අධිශ්ඨානයෙන් පෙරට ගියොත් එතැනිනුත් එහෙට යන්න පුළුවන්.

ඒවගේම විදී ලාම්පු ගැන කතා වුනා. කනගාටුවෙන් කියනවා මම ගිය අවුරුද්දේ පෙබරවාරි හෝ නොවැම්බර් ලේකම් අතට දුන්නේ ලියුම ඊට පස්සේ අයෙත් ලියුමක් දුන්නා. අහනකොට කියනවා හරි එවනවා කියලා. නෑ. මම කතා නොකර හිටියා ටික දවසක්. අද මේක සම්බන්ධව කතා කරපු නිසා මම මේ ඇහුවේ. තියෙන වීදී ලාම්පු අලුත්වැඩියා කරලා දෙන්න කියලා කියන්නේ. එකක් අලුත්වැඩියා කරලා දීලා මට කිව්වාම මම කියනවා හරි ඔක්කෝම හදන්න එනවා කියලා.හැබැයි බතලවත්ත හංදියට ටක් ගාලා හදලා එනවා. ඊට පස්සේ මට කියනවා ඔයාට කියලා වැඩක් නැහැනේ මම එක කෝල් එකයි දුන්නේ ඇවිල්ලා හදලා ගියා කියලා. හැබැයි අනිත් ඔක්කෝම පිච්චිලා. ඒක නිසා ඒ ඔක්කෝම හදලා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. එහින්දා අපි ඉතාමත්ම ඉක්මනින් මේ දෙවෙනිදා වැඩ ආරම්භ කරන්න තියෙනවා මේ සියළු සංවර්ධන යෝජනා වල එතකොට කවුද ෆෙල් කියන ඒක අපිට බලා ගන්න පුළුවන් වෙයි. ඒ හින්දා අපි ඒ සඳහා අවශ්‍ය අවකාශය ලබා ගනිමින් මේ අලුත් අවුරුද්දේ  අපි සියළු දෙනාටම ඉතාමත්ම ශක්තිමත්ව මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ගමන යන්න හැකියාව ප්‍රාර්ථනා කරමින් අපි අයවැයෙන් වෙන් කරපු මුදල් යම් කෝටා එකකට වෙන් කරා මෙච්චර කල් අපිට එක වියදම් කර ගන්න බැරි වුණා. අපි මේ අවුරුද්දේත් වෙන් කරා සුසාන භූමි සම්බන්ධයෙන් මා යෝජනවක් ඉදිරිපත් කරනවා  අපේ තල්දෙන හා බතලවත්ත සුසාන භූමි දෙකක් තියෙනවා එකේ ඉඩකඩ යම් යම් අත්පත්කර ගැනීම් තියෙනවා නීතියානුකූලව සිතියම්ගත සුසාන භූමි දෙකක් ඒ දෙක මැන නිරවුල් කර දෙන්න කියලා අයවැය මුදල් යොදවලා අවශ්‍ය කටයුතු කරලා දෙන ලෙස ඉල්ලමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මීළගට මූලාසන සභාව අමතා මූලාසනයට පිළිතුරු කතාව සභාවට ඉදිරිපත් කරන ලදි.**

මූලාසන සභාව අමතමින් සියළු දෙනාටම සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා මුලින්ම. ඇත්තටම අද දවස මේ 2022 සිතුම් පැතුම් ඉටු වෙන නව වසරක් වේවි. මොකද හේතුව අපි බොහොම අමාරුවෙන් මුලින් ඇද ගෙන ආපු ප්‍රාදේශිය සභාව අපි ඇත්තටම මේ වෙන කොටමම අද තමයි දැන් තමයි තීරණය කරලා තියෙන්නේ.මට හිතාගන්න පුළුවන් වෙලා තියෙන්නේ අපේ මන්ත්‍රීවරු කතා කරා වගේ අපි ඇත්තටම මේ කොට්ඨාශය පුරාවටම ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ  යටතේ මගේ මන්ත්‍රී

කණ්ඩායම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම, ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයා මේ සියළු දෙනත් එක්ක එකතු වෙලා අපි විශාල වැඩ කොටසක් කරා. හැමෝම එකතු වෙලා වැඩ කරපු නිසා මං හිතනව මීගහකිවුල ප්‍රාදේශීය සභාව ඉතාම ඉදිරියට ගිහිල්ලා තියෙනවා. ඉතිං ඒ හින්දා අර සුන්දර පුරවරයක් ඒක්ක සුන්දර අදහස් තියෙන රටක් මේ නගරයක් වශයෙන් අපිට ගෙනියන්න දැන් දැන් ලැබිගෙන එනවා. අපි දන්නවා මීගහකිවුල නගරේ ගැන මුලින්ම

කතා කරනවා අපි මේ හැම දෙයක්ම කතා කරද්දී අපි ගම හැදුවා කියන එක අපේ රංගන මන්ත්‍රීතුමා අපේ රත්නතිස්ස මන්ත්‍රීතුමා චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා මේ සියළු දෙනාම කිව්වා අපි ගමේ මාර්ග විශාල වශයෙන් ඇත්තටම හදලා තියෙන්නේ. ඒක පැහැදිලි ඇත්තක්. හැබැයි අපේ නගරයේ ප්‍රශ්නයක් තියෙනවා. අපේ නගරයේ ප්‍රශ්නය අපි හින්දා ඇති වෙච්ච දෙයක් නෙමෙයි. ඊයේත් මගෙන් වෝයිස් කට් එකක් ගත්තා හිරු රූපවාහිනියෙන් ඇවිල්ලා. මේ නගරයේ ස්ටෑන්ඩ් එකට මොකක්ද වෙන්නේ. අපිට තියෙන ප්‍රශ්නේ එච්චරයි. අපේ නගරය ඇයි දියුණු වෙන්නේ නැත්තේ. අපේ නගරය දියුණු වෙන්න ප්‍රධාන හේතුව බස් ස්ටෑන්ඩ් එකේ යන්න පාරක් තියෙනවා එන්න පාරක් නැති මේ බස් ස්ටෑන්ඩ් එක නිසා අපිට ඇත්තටමමේ නගරයේ ජනතාවට අලුත් අත්දැකීමක් අලුත් ව්‍යාපාරයක් අලුත් දෙයක් කඩ කාමර පේලියක් නිර්මාණය කරන්න අපිට හැකියාවක් නැහැ මොකද හේතුව අපිට ඉඩකඩ නැහැ බස් ස්ටෑන්ඩ් එකක් හදන්න ඉඩක් නැහැ. හදපු බස් ස්ටෑන්ඩ් එක ෆෙල්. අපි එක පිලිගන්නවා. ඒක නෑ කියලා කියන්න බැහැ. නමුත් මේ වෙන කොට පළාත් පාලනයෙන් මුදල් වෙන් කරනවා කියලා කිව්වා. පෞද්ගලික ඉඩම් ටික පවරා ගෙන ඒ ටික සංවර්ධනය කරලා යම් මාර්ගයක් දාන්න ඕන. එහෙම වුනොත් නම් යම් දෙයක් හෝ වෙනවා. ඒක හරි අපිට පළාත් සභාවෙන් ප්‍රධාන ලේකම්තුමා කියපු පරිදි අපිට හදලා දුන්නොත් දැනට ප්‍රාදේශීය ලේකම්ට ෆයිල් එක එවලා තියෙනවා. අපිට ඒක ලැබුනොත් අපිට පුළුවන් වෙයි පොඩි මාර්ගයක් හදලා සාමාන්‍යයේ හරි ජනතාවට පුංචි දෙයක් හරි කර ගන්න කඩ පේලියේ හරි වැඩක් කරගෙන යන්න අපිට දෙන්න. මේ වෙන කොට දැනට වෙමින් පවතිනවා ප්‍රාදේශීය ලේකම්තුමිය සාකච්ඡා කරන්න ඕන හෙට අනිද්ද දිහාවට මේ ප්‍රශ්නේ. අපි දන්නවා දැන් ඇත්තටම නගරයට ජලය සැපයුවා දුන් මිනිස්සුන්ට කතා කරන්න කියන්න දෙයක් නැහැ. දැන් ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වෙනවා. ඒත් තෙක්කම ගහපු නල ළිං වල ක්‍රියාකාරීත්වය සඳහා මොටර් ටික ගෙන්නලා හයි කරන්න ඕන ලබන මාසේ වෙද්දී. එතකොට පිහිල්ලට අවශ්‍ය ජලය ටික ලබා දෙන්න මේ සැරේ වැස්සට ජල උල්පත් අපි දැක්කේ නැහැ . ඒ නිසා මං හිතන්නේ ඒක කරෝත් අපිට පුළුවන් වෙයි මේ නගරයේ ඒ සුන්දර පුරවරය ජනතාව ඉහලින්ම බාර ගන්න කැමති වෙයි අඩුම ගානේ වතුර ටික හරි දිලා වතුර ටික මීගහකිවුල ප්‍රාදේශීය සභාව හරහා කෙරුනා කියන කාරණාව ගියොත් හැබැයි දැන් දැන් හුඟ දෙනෙක් ලකුනු දාගන්න ට්‍රයි කරනවා ඒ නිසා ප්‍රාදේශීය සභාවේ බලය හැමදාම ප්‍රාදේශීය සභාවත් තෙක්ක කතා කරලා මා සමඟ ඔබ හැම වේලාවේම රණ්ඩු කරලා හරි ගත්ත යෝජනා ක්‍රමයක්. දැන් ඕන කෙනෙකුට ඒකේ ලකුණු දාගන්න පුළුවන්. හැබැයි ලකුනු දාගන්න මේකේ මුල ඉඳන්ම මහන්සි වුනේ වියදම් කරේ මීගහකිවුල ප්‍රාදේශීය සභාවෙන් අපේ පෞද්ගලික ධනය වියදම් කරලා තමයි ව්‍යාපෘතිය හදලා මෙච්චර දුරකට ගේනාවේ. දැන් නම් ඕන කෙනෙකුට කියන්න පුළුවන් අපි තමයි මේක ගේන්නේ අපි තමයි කරේ කියලා කියන්න පුළුවන්. නමුත් අපි තමයි මේක ගේනාවේ කියලා ඔයගොල්ලන් මන්ත්‍රීවරු වශයෙන් බය නැතුව කියන්න.ජනතාව අතරට ඔය මතය යන්න දෙන්න එපා වෙනත් කණ්ඩායමක් නෙමෙයි මේක කරන්නේඅපි තමයි කරන්නේ කියලා ඔබ ලකුණු දාගන්න ඕන. අපේ යෝජනාවට තමයි සභාවෙන් ගෙනාවේ කියන ඒක විශේෂයි ඒක හොඳටම යනවා. අපි නෙවෙයි මේක කරන්නේ අපිට කරලා දෙනවා වාගේ. ඒ හින්දා මේක කරේ අපි ඒක පැහැදිලිව කියන්න පුළුවන් ඕනි රැස්වීමක බය නැතුව කියන්න පුළුවන්. ඒක විශේෂයෙන් මතක් කරනවා. එහෙම වුනොත් මීගහකිවුල නගරයේ ඔය කියන කාරණා ටික විසඳ ගන්න පුළුවන්.එතකොට නගරයේ අවට සියළු සංවර්ධන කටයුතු බෝහෝ දුරට දැන් සිදු වෙමින් පවතිනවා. සිදු වෙලා තියෙනවා පුංචි ලෝකාන්තයේ පැත්ත තවත් හොඳට සුන්දරව දියුණු වීගෙන යනවා. කැටවත්තේ හදන්න පාර වල් නෑ . කැදෑන්තමංකඩ පාර කරේ තිව්වා.දැන් අපි එක හදලා දෙන්න ඕන. ඔයගොල්ලෝන්ගේ පාලම් පාරවල් තියෙනවා නම් මේ ව්‍යාපෘතියම දෙන්න අපිට ඒ ටික කරගන්න පුළුවන් වෙයි.අපිට සභාවක් වශයෙන් මං හිතන්නේ ඇත්තටම සතුටු වෙන්න පුළුවන්. අපි ගොඩක් කාරණා වලදී අපි හොඳට මේ සභාවේදී වැඩ කටයුතු හැම කෙනෙකුටම කරගෙන යන්න පුළුවන් ආකාරයට කෙරුනා. එක්සත් ජාතික පක්ෂයේ විපක්ෂ

නායකතුමත් ඔය කෑ ගැහුවට අපේ මනත්‍රීතුමත් ඒ ඔක්කෝම එක කණ්ඩායමක් ඒ නිසා මම පැතතක් ගන්නේ නැහැ අපි ඔක්කෝම එකතු කරලා හැබැයි කිසිම අසාධාරනයක් වෙන්න ඉඩ තියන්නේ නැහැ. හැම දෙනෙක්ම ඇඳ ගෙන යන්න තමයි මගේ වගකීම.ඉතින් මම මගේ වගකීම හැමදාම ඉෂ්ඨ සිද්ධ කර ගෙන ගියා අද එපා වෙන කෙනා හෙට ඕන වෙයි ඒක නිසා අපි සියළු දෙනා එක කණ්ඩායමක් වශයෙන් වැඩ කරන්න ඕන. අපිට පුළුවන් පුංචි ලෝකාන්තයේ වැඩ ටිකක් ඉක්මනට ආරම්භ කරන්න.

ඒ වගේම අපිට LDSP එකෙන් ලබලා දුන්නා ලයිට් ටිකක් ඒකට ලක්ෂ 20ක් වෙන් කරලා තියෙනවා. ඒකට මං ඔක්කෝම හදලා තියෙන්නේ ඒ ලයිට් ටිකක් ඔයගොල්ලන් කියන හැම තැනකම ලයිට් කණු වලට දාන්න පුළුවන්. අපේ කෘෂ කැබ් එක යවලා අපේ විදුලි කාර්මික යවලා තියෙන බල්බ් ටික හයි කරලා දෙන්න. ඉතුරු ටික දාන කම් ඒ වැඩේ කරන්න පුළුවන්.දැන් අපේ සභාවේ ඇවිල්ලා ගිය මාසේන් පස්සේ සේවකයෝ නැහැ කියලා කාටවත් කියන්න බැහැ. සේවකයෝ ඕනතරම් ඉන්නවා වැඩ කරන්න ඕනි දැන් හොඳට. මම ටිකක් තදට ඉන්නවා. උප සභාපතිතුමාට ස්තූතිවන්ත වෙන කාරණාවක් තියෙනවා මං පහුගිය දවස්වල වැඩ තහනම් කරා දින 7ක් සේවකයින්ගේ වැඩ නැවැත්තුවා. සමහරවිට එගොල්ලෝ හිතවත් අය මම එතුමාලාට කියලා ආවේ නැතිතම් මේක හැදෙන්නේ නැහැ. හැබැයි ඒ හදලත් ඊයේ හවස staff meeting එක ගන්නකොට හතරදෙනෙක් නැහැ අත්සන් කරපු අය. මම ඒ ගොල්ලන්ටත් ලියුම ගහන්න කිව්වා. වැටුප් කපලා දින 7ක් වැඩ තහනම් කරනවා. එත් තෙක්කම අපේ මිනිස්සු දැන් ඔබතුමාලා කිව්වා වගේ හිටගෙන ඉන්නවා ඉදගෙන ඉන්නවා ඇත්තටම වැඩපරිපාලක කියන කිසිම දෙයක් කරන්නේ නැහැ සේවකයෝ වැඩපරිපාලක පැත්තට වැටිලා ඉන්නේ ඒක තමයි මේ මම හයිය හදලා දෙන්නේ.මම කිව්වා ලියුම් ගහන්න.මේක නැත්තම් කරන්න බැහැ. එක එක තැන කල්ලි ගැහිලා කොමසාරිස්තුමාට විඩීයෝ එක ගිහින් දෙන්නම් කියනවා සභාපතිතුමාගේ ගෙදර වැඩ කරපු විඩීයෝ එක ගිහින් දෙන්නම් කියනවා.අපේ ගෙදරත් ඒක ගෙන යනවා මම තනියමනේ ඉන්නේ.අපි පහුගිය දවස්වල මමත් ඔබත් මාර්තු මාසේ විසුරුවනවා කියලා හිතාගෙන හිටියේ.ඒක නිසා මේගොල්ලන් අපිව ගනන්ගන්නේ නැහැ.අපි කොච්චර අනුකම්පා කරත් සමහර අවස්ථාවල දේශපාලනය කරන්නේ නැහැ බොහොම ආදරයෙන් කටයුතු කරන්නේ ඒ හැම අවස්ථාවක් බැලුවත් ඒගොල්ලන් මොකද කරන්නේ අපි යන්නේ කොයි වේලාවේද  කියලා බලාගෙන ඉන්නේ පිරිසකුත් මේ සේවකයෝ අතර ඉන්නවා. හුඟදෙනෙක් මෙතන කණ්ඩායම් ගැහිලා ඉන්නේ.අපි යන්නේ නැහැ කියපුවාම අපේ ගෙවල් වටේ කැරකෙනවා මගේ වාහානේ නවත්තන්න බැහැ ඇවිල්ලා රෙදි කැල්ලක් අරගෙන වාහනේ පිහිනවා. ඒ තත්වයට පත් වෙලා ඉන්නේ. ඒ හින්දා ඔබතුමාලා කිව්වා වගේ අපිට එහෙම ප්‍රශ්න නැහැ අපිට ඡන්දේ දුන්නත් එකයි නැතත් එකයි.අපි පැහැදිලිවම මේ දවස් වල සේවකයොන්ට මම අවස්ථාවක් දෙන්නේ නැහැ වැඩ කරන්නම ඕන. හැබැයි ඊයේ පෙරේදා හොදටම දකී කියලා මීගහකිවුල ශ්‍රමදානය සාර්ථකව කරා. අදත්හොදටම වැඩ කරනවා දැන් වැඩ ටික කරගෙන යනවා.අර වගේ දෙන්නෙකුට තුන්දෙනෙකුට කරපු නැති නිසා තමයි ලේකම්තුමියගේ තිබුණ දැඩි අනුකම්පාව නිසා තමයි මේ තත්වයට අපේ සභාව වැටුණේ. දැන් අපි ඒ අනුකම්පාව භූමිකම්පාවක් කරගෙන ඉන්නේ මම කියන්න කලින් එයා ලියුම ගහනවා. ඒක නිසා මට ප්‍රශ්නයක් නැහැ. ඒවගේම බයිසිකලේ ටයරක හොරකම් කරලා ඒවගේම තවත් මොනද හොරකම් කරලා මුරකාරයෝ දෙන්නෙක් මේකේ ඉන්නවා. මුරකාරයෝ ඉන්න ඕන අනිත් සේවකයෝ වැඩක් නැහැනේ. සේවකයෝ නැති වුනාම මුරකාරයෝ දෙන්නාගෙන් එක් කෙනෙක් හරි දැන ගන්න ඕන. මුරකාරයෝ දෙන්නාට මම කිව්ව ගෙවන්න කියලා ලියුම ගහලා තියෙන්නේ. අපි දන්නවා ගොඩක් ප්‍රශ්ණ වල ඉන්න මුරකාරයෝ ඉන්නවා. කරන්න දෙයක් නැහැ ඒක අපි ගෙව්වෝත් තමයි ඒ වැඩේ කරන්නේ. අපිට පුළුවන් මේකේ පරිපාලනය හරියට කරගෙන යන්න අපි දැන් ගොඩක් දේවල් හරියට කරගෙන යන නිසා ඒ අඩුපාඩු ඔක්කෝම හදා ගෙන්නවා. ඔෆිස් එකේ අපේ සභාව විතරක් වත් හරියට ෆෝම් සෙට් ටිකයි ලියුම් ටිකයි දෙන්න. වැරැද්ද නිවැරැද්ද කර ගන්නේ නැතුව අපි පොඩි පොඩි දේවල් කර ගන්නේ නැතුව අපිට ඒ ටික දෙන්න මමත් බලන්නම්. ඒක නිසා අපිට මේ අවුරුද්ද ගොඩක් වැඩ කර ගන්න පුළුවන් අවුරුදදක් වෙනවා.

විශේෂයෙන්ම අපිට මුදල් ප්‍රතිපාදන ගොඩක් අපේ අයවැයෙන් වෙන් කරලා තියෙනවා. ඒ මුදල් දැනටම අපිට ලැබිලා තියෙනවා. මාර්තු මාසේ රංගන මන්ත්‍රීතුමාගේ යෝජනාවට වියදම් කරන්න වෙනවා. ඒ දෙකත් කරලා අපිට තවත් සංවර්ධන කටයුතු කරන්න පුළුවන් අපි කරමැටියේ කඩ 3ක් හදනවා. ප්‍රයිවට්

පාර්ටන ෂිප් යටතේ ඒ ප්‍රොර්ගෑම් එක ගෙනල්ලා මහියංගනෙන් ඒ විස්තර ටික ගෙනල්ලා ඒ විදිහට පටන් ගන්නවා පොල ලඟ කඩ ටික හදලා දාන්න.හරි කැතයි මීගහකිවුල නගරයට. ඒ නිසා එකත් හදලා දැම්මොත් එතැනත් කඩ 7ක් 8ක් හදලා දැම්මොත් ඉන්න මිනිස්සුන්ට දෙන්න පුළුවන්. ඒ වගේ කඩ කමෙර 4ක් තියෙනවා. ඒකටත් ටෙන්ඩර් දාලා තියෙන්නේ. ඒකට රු:ලක්ෂයක් වගේ වියදම ගිහිල්ලා තියෙනවා ඊට වැඩිය ඒතැන වටිනවා.හැබැයි නගරයේ අවට නැතුව වෙන ස්ථාන වල තියා ගන්න

පෞද්ගලික ස්ථාන තියෙනවා නම් අපිට දෙන්න පුළුවන් පහසු ගෙවීම යටතේ. ඔබතුමා මැදිහත් වෙලා හරි කමක් නැහැ ඒක දීලා දාන්න. කීයක් හරි සභාවට බැඳලා ඉතිරි ටික පහසු ගෙවීමේ ක්‍රමයට හරි බේදලා දෙන්න තීරණය කරලා තියෙන්නේ. කිරිහල ටෙන්ඩර් දාලා තියෙන්නේ.ඉදිරියට අපිට වැඩ ටිකක් කරන්න පුළුවන්. මන්ත්‍රීවරුන්ට දැන් කාල වේලාවක් නැහැ. විශේෂයෙන්ම හෙට තියෙනවා කිලෝමීටර් ලක්ෂයේ ව්‍යාපෘතියේ අඩුපාඩුකම් කියන්න. මහියංගනේන් අපේ කොට්ඨාශයේ සියළුම රිපොට් ගෙන්න ගත්තා කරලා තියෙන වැඩ වල. අඩුපාඩුකම් ටිකක් මම ඊයේ ඉදන් හොයලා තියෙනවා. ඔබතුමාගේ අයි ප්‍රොජෙට් එක ගැනත් අපි හෙට කතා කරනවා.ඔබතුමාගේ ගෙදර ලඟ පාලම හදලා දෙන්නේ නැහැ. ඒක නිසා ඔබතුමත් රිපොට් එකක් දෙන්න.අයි රුඩ් එක අවුරුදු 11ක් විතර පාර හදනවා.ඒ තියෙන ප්‍රශ්න අපිට කතා කරන්න පුළුවන්. ලිස්ට් ඒකේ තියෙන නම් ටික කතා කරන්න පුළුවන් අනිත් ඒවා ටිකත් අපිට කරගන්න පුළුවන් කියක කාරණාව මතක් කරමින් තවත් විශේෂ කාරණාවක් නැහැ.ඔබතුමන්ලාගේ පැමිණීම ඉතාමත් විශේෂයෙන්ම මට දක්වන සහයෝගයට අවුරුදු 4ක් පුරාවටම අපේ උප සභාපතිතුමා විපක්ෂ නායකතුමා ඇතුළු මගේ මන්ත්‍රීතුමන්ලා අපේ ජේෂ්ඨ මන්ත්‍රීතුමා උඩලකුඹුර මැතිතුමා ඒවගේම රංගන මන්ත්‍රීතුමා ලතා මන්ත්‍රීතුමිය නිමල් මන්ත්‍රීතුමා ශ්‍රියාණි මන්ත්‍රීතුමිය, රත්නතිස්ස මන්ත්‍රීතුමා, නන්දන මන්ත්‍රීතුමා, චමින්ද මන්ත්‍රීතුමා, මංජුල මන්ත්‍රීතුමා විශේෂයෙන්ම හෙවනැල්ලක් වගේ ඉන්නවා ඒතුමා පත්මා මන්ත්‍රීතුමිය ඒ නිසා කිසි ගැටළුවක් නැහැ බාල මන්ත්‍රීතුමා හැබැයි මම දකින්නේ අපි කණ්ඩායමක් වගේ හිටියා. විපක්ෂ නායකතුමා ඔබතුමා විශේෂයෙන්ම මේ කණ්ඩායම බැලන්ස් කර ගන්න ඔබතුමාට ඒ ශක්තිය ලැබෙන්න ඕන. එතකොට තමයි මේ කණ්ඩායම බැලන්ස් වෙන්නේ. කණ්ඩායම් හැඟිමක් තියෙන්න ඕන. ඒ කණ්ඩායම් හැඟිම මං ලඟ තිබුණ නිසා තමයි මං මේ පක්ෂ විපක්ෂ ඔක්කෝම ඒකරාශී කර ගෙන අපි හදවතින් අවංකව ඔයගොල්ලෝන්ට කතා කරපු නිසා තමයි අපේ මන්ත්‍රීවරයෙක් බේරගන්න ඒක තමයි අපේ ප්‍රධාන යුතුකම වෙලා තියෙන්නේ.මම හැමවෙලාවේම මගේ මන්ත්‍රීවරයෙක් කිසිම තැනක අසාධාරනය වෙන්න ඉඩ තියන්නේ නැහැ.හැම මන්ත්‍රීවරයෙක්ම හැදෙන්න ඕන ඊලඟ පරම්පරාවට දේශපාලනය කරන්න පුළුවන් වෙන්නේ අපිටත් ශක්තියක් තිබුනොත් විතරයි. මන්ත්‍රීවරයෙන්ට වාහනයක් තියෙන්න ඕන මේ දේශපාලනය කරනවා වගේම තමන්ගේ ව්‍යාපාරත් ඒත් තෙක්කම දියුණු කරගෙන යන්න ඕන. තමන් ව්‍යාපාරයක් පටන් ගන්නවා නම් ඒ ව්‍යාපාරයට ලොකු ශක්තියක් තියෙනවා මේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී කමෙන්. තමන් ගැනත් පොඩ්ඩක් හිතන්න.මේ ඉන්න අවුරුද්ද තුල තමන්ගේ ආර්ථිකයත් සංවර්ධනය කරගන්න රටේ ආර්ථිකයත් සංවර්ධනය කරන්න උදව් කරන්න ගමේ ආර්ථිකයත් ගොඩනගා ගෙන ගියෝත් තමයි අපි කණ්ඩායමක් වශයෙන් අපි මන්ත්‍රිවරු වශයෙන් අපි මිනිස්සු වශයෙන් ශක්තිමත් වෙනනේ. තමන් හැදෙන්නත් ඕන් තමන්ට යමක් තියෙන්නත් ඕන.මම කියන්නේ ඒක වංචනික විදියට ගන්න කියලා නෙමෙයි.තමන්ගේ පැත්තත් ගොඩනගා ගන්න කියන ගෞරවනීය ඉල්ලීම කරමින් සුභ පතමින් ඔබේ මානසික හා සියළුම ශක්තින් වර්ධනය කර ගෙන සුභම සුභ නව වසරකට මුහුණ දීලා මීගහකිවුලත් හදනින් ගමන් රටත් හදනින් ගමන් ඔබත් හැදෙමින් මේ රටේ සියළුම දෙනාට ආශිර්වාද කරනවා සුභ අලුත්අවුරුද්දක් කියලා ඒ වගේම ඔබ සියළු දෙනාටත් සුභ අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරනවා ඒවගේම මගේ ඔෆිස් ඒකේ ඉන්න ලේකම්තුමිය TO මහත්තයා ඒවගේම අපේ ගුණරත්න මහත්තය ඇතුළු ඒ කණ්ඩායමටත් ජානක මහත්තයා ඇතුළු ඒ කණ්ඩායමටත් සියළු දෙනාටමත් නිදුක් නිරෝගි සුභම සුභ අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරනවා. ඉතින් මේ වසරේදී තියෙන අඩුපාඩු ඔක්කෝම හදා ගෙන හොද ගමනක් යන්න අප සියළු දෙනාටම ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් ඔබ සියළු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා.

සභාපති
ප්‍රාදේශීය සභාව,මීගහකිවුල

2021 ........................................................ වන දින මීගහකිවුල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේදී ගරු ප්‍රාදේශීය සභා උප සභාපති/ගරු මන්ත්‍රී ............................................................... මැතිතුමා විසින් යෝජනා කිරිමෙන් හා ගරු ප්‍රාදේශීය සභා උප සභාපති/ගරු මන්ත්‍රී.....................................................................මැතිතුමා විසින් ස්ථිර කිරිමෙන් 2021 ............................................................ දින පැවැත්වූ මාසික මහ සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව ඒකමතිකව පිළිගන්නා ලදි.

එස්.එම්.එල්.එච්.ජයවර්ධන,
සභාපති,
ප්‍රාදේශීය සභාව, මීගහකිවුල.